(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 2.]

# පාර්ලිමේන්තුවේ

# න්‍යාය පුස්තකය

## 2016 පෙබරවාරි මස 09 වැනි අඟහරුවාදා ඇතුළුව එදින සිට

## නිකුත් කළේ 2016 ජනවාරි මස 29 වැනි සිකුරාදා

---

## 2016 පෙබරවාරි මස 09 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

69/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියන් සාගරයේ ජාත්‍යන්තර මුහුදු කලාපයේ මසුන් ඇල්ලීමට චීන යාත්‍රා වලට අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලබා දී ඇති යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(iii) එම යාත්‍රා හා ශ්‍රී ලංකාව අතර ඇති ගිවිසුමට අදාල බැඳීම් කවරේද;

(iv) මෙලෙස අවසර ලබා දීම තුළින් අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර මුහුදේ මසුන් අල්ලන ශ්‍රී ලාංකික යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(ii) චීන යාත්‍රා හේතුවෙන් ශ්‍රී ලාංකික ධීවරයින්ට සිදුවන අසාධාරණ මැඩලීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) චීන යාත්‍රා සඳහා අවසර ලබාදීම වෙනුවට ශ්‍රී ලාංකිකයන්ට විශාල ධීවර යාත්‍රා ලබා ගැනීම සඳහා උපකාර නොකිරීමට හේතු කවරේද;

(iv) ශ්‍රී ලාංකිකයන්ට ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු කිරීම සඳහා විශාල ධීවර යාත්‍රා හා නවීන තාක්ෂණික මෙවලම් සමග අවශ්‍ය පහසුකම් ලබා දීමට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, ඒ කෙසේද; කවර දිනක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

222/'15

2.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාර්ග සංවර්ධන අධිකාරියෙහි අධීක්ෂණය යටතේ අයි - රෝඩ් (i -Road) යනුවෙන් විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය සඳහා ණය මුදල් සැපයූ විදේශීය මූල්‍ය ආයතන;

(ii) එම ආයතන සමඟ ණය ගිවිසුම් අත්සන් කළ දිනය;

(iii) ඊට අදාළ කොන්දේසි;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයි-රෝඩ් ව්‍යාපෘතිය සඳහා,

(i) තෝරාගත් මාර්ග;

(ii) එකී මාර්ග තෝරාගත් දිනය;

(iii) එක් එක් මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත් ආයතනය;

(iv) අදාළ ඉදිකිරීම් ආයතන සමග ගිවිසුම්ගත වූ දිනය;

(v) එකී ගිවිසුම්වලට අනුව ඉදිකිරීම් අවසන් කළ යුතු දිනය;

(vi) 2015.11.01 දින වනවිට ඉදිකිරීම් කටයුතු අවසන් කළ මාර්ග;

කවරේද යන්න එක් එක් ප්‍රාදේශීය සභාව අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

236/'15

3.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනාධිපතිවරණය පාදක කර ගනිමින් දිවි නැගුම දෙපාර්තමේන්තුව මගින් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ ඡායාරූපය සහිත ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කොට රුපියල් 29,400,000ක මුදලක් අවභාවිතා කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂය සඳහා සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 18ක් අතර බෙදා හැරීමට ලිත් ලක්ෂ 50 මුද්‍රණය කළ හේතුව කවරේද;

(ii) අදාළ වියදම අනුමත කළ බලධාරියා කවුරුන්ද;

(iii) ඔහුට එම මුදල අනුමත කිරීමේ බලය තිබේද;

(iv) මෙම ලිත් ලක්ෂ 50 මුද්‍රණය කළ ආයතනය කවරේද;

(v) ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දිවි නැගුම අරමුදලේ මුදල් තම පක්ෂයේ මැතිවරණ ප්‍රවර්ධනයට යොදා ගැනීමෙන් සිදු කර ඇති මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් සිදු කරනු ලබන විමර්ශනයේ ප්‍රගතිය කවරේද;

(ii) අදාළ දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය මගින් මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එහිදී ගත් විනය ක්‍රියාමාර්ගය කවරේද;

(iv) මේ සඳහා වියදම දරා ඇත්තේ දිවි නැගුම අරමුදලින් නම්, සිදු වූ පාඩුව පියවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

249/'15

4.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.10.15 දින පස්වරුවේ අධික වැසි සහිත කාලගුණයක් පවතිද්දී, මහනුවර කටුගස්තොට ප්‍රදේශයේ අනාරක්ෂිත කාණුවකට වැටීමෙන් මහ / බදියුද්දීන් මහමුද් බාලිකා විද්‍යාලයේ උසස් පෙළ පන්තියේ ඉගෙනුම ලැබූ පාතිමා අස්රා ශිෂ්‍යාව මියගිය බව එතුමා දන්නෙහිද?

(ආ) අනපේක්ෂිත ලෙස සිදුවූ අනතුරකින් මියගිය එම ශිෂ්‍යාවගේ ජීවිතය අහිමිවීම නිසා වියෝවට පත්ව සිටින ඇයගේ දෙමව්පියන්ට, වන්දි මුදලක් පිරිනැමීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

276/'15

5\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.01.09 දින සිට 2015.10.31 දින දක්වා කාලවකවානුව තුළ නීතිපතිවරයාගේ උපදෙස් මත,

(i) ඇප ලබා දුන් ත්‍රස්තවාදි සැකකරුවන් සංඛ්‍යාව;

(ii) ඇප ලබා දුන් ත්‍රස්තවාදි විත්තිකරුවන් සංඛ්‍යාව;

(iii) ජනාධිපති සමාව ලබා දුන්, ත්‍රස්තවාදි ක්‍රියාවන්ට වැරදිකරුවන් වූ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

284/'15

6\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙහෙර විහාරස්ථාන සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) වෙහෙර විහාරස්ථාන සඳහා මුදල් වෙන් කිරීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිටින දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් ගුරුවරයෙක් සඳහා ගෙවනු ලබන දීමනාව කොපමණද;

(iii) එම මුදල ප්‍රමාණවත්ද;

(iv) එසේ නොවේ නම්, එම මුදල වැඩි කිරීම සඳහා කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

314/'15

7\.

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටිය, ජනාධිපති විද්‍යාලයේ පළමු වසරට දරුවන් ඇතුළත්කර ගැනීමේදී අක්‍රමිකතා සිදු වී ඇති බවත්;

(ii) විදුහල්පතිවරයා ඒ සඳහා සෘජුවම සම්බන්ධ වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ජාතික පාසැල් අධ්‍යක්ෂ විසින් පරීක්ෂණ පවත්වා තිබේද;

(ii) එසේ නම්, පරීක්ෂණ පැවැත්වූ දිනය කවරේද;

(iii) එම පරීක්ෂණවල ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අක්‍රමිකතා සඳහා සම්බන්ධ වී ඇති විදුහල්පතිවරයා සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) මෙම විදුහලේ අනාගතය වෙනුවෙන් ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

323/'15

8.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට තුළ දැනට හඳුනාගෙන ඇති තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් දිස්ත්‍රික්ක අනුව විසිරී ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004.07.02 දින එවකට නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදී ඇටමිදුළු ස්ටෙම් සෛල බද්ධ කිරීමේ මධ්‍යස්ථානයක් කුරුණෑගල ශික්ෂණ රෝහල තුළ ඉදිකිරීමට එකඟ වූ බවත්;

(ii) ඒ සඳහා වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ 100ක ප්‍රතිපාදන වෙන්කර තිබූ බවත්;

(iii) මෙම ඇටමිදුළු බද්ධය සඳහා පුහුණුව ලැබූ වෛද්‍යවරුන් රජයේ රෝහල්වල සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙරට පෞද්ගලික රෝහලක් තුළ ඇටමිදුළු ස්ටෙම් සෛල බද්ධය සිදුකර තැලසීමියා රෝගීන් සුවපත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, මෙතෙක් ඇටමිදුළු ස්ටෙම් සෛල බද්ධ කිරීමේ මධ්‍යස්ථානයක් කුරුණෑගල ශික්ෂණ රෝහල හෝ රිජ්වේ ආර්යා ළමා රෝහල හෝ වෙනත් රජයේ රෝහලක් තුළ ස්ථාපිත නොකිරීමට හේතුව කවරේද;

(iii) තැලසීමියා රෝගීන් සඳහා දැනට පවතින ප්‍රශස්ත ප්‍රතිකාර ක්‍රමයක් වන ස්ටෙම් සෛල බද්ධය රජයේ රෝහල් තුළ සිදු කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

70/'15

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව පුරා ගව කුර හා මුඛ රෝගය ඉතා සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින බවත්;

(ii) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව මෙම රෝගය වැළැක්වීමට දිය යුතු එන්නත් ප්‍රමාණවත්ව නොමැති බවත්;

(iii) එම රෝගය පාලනය කිරීම සම්බන්ධයෙන් උක්ත දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ චක්‍රලේඛයේ බොහෝ කරුණු අවලංගු කර තිබෙන බවත්;

(iv) එසේ කිරීම හේතුවෙන් එම රෝගය පාලනය කිරීමට නොහැකි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ චක්‍රලේඛයෙන් ඉවත් කළ කරුණු කවරේද;

(ii) එම කරුණු ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) නැවත එම කරුණු ඇතුළත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) ගව කුර හා මුඛ රෝගය පාලනය කිරීමට අවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

(v) එම රෝගය නිසා විනාශ වන ගව සම්පත බෝ කිරීමට ගන්නා කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 දෙසැම්බර් 22 දිනැති අංක 1946/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා,— පඩිපාලක සභා ආඥාපනත යටතේ නියෝගය,— (136 වැනි අධිකාරය වූ) පඩිපාලක සභා ආඥාපනතේ 63 වැනි වගන්තිය යටතේ, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016.01.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ක්ෂුද්‍රමූල්‍ය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ කරන නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 අගෝස්තු 6 දිනැති අංක 1926/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජනවාරි 15 දිනැති අංක 1793/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2013 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝගවල ඇතුළත් 13 සහ 17 වැනි වගන්ති සංශෝධනය කරමින් 2015 නොවැම්බර් 9 දිනැති අංක 1940/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.01.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය පත්කිරීම සඳහා යෝජනා සම්මතය,— කල් තබන ලද ප්‍රශ්නය. (2016 ජනවාරි 09),— "ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කර ගත යුතු යැයි ශ්‍රී ලාංකික ජනතාව අතර පුළුල් එකඟතාවයක් ඇති හෙයින් ද;

2015 ජනවාරි මස 08 වැනි දින පැවති ජනාධිපතිවරණයේදී නීතියේ ආධිපත්‍යයට ගරු කෙරෙන සහ ප්‍රජාතන්ත්‍රවාදය සවිමත් කෙරෙන දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීමෙහි ලා පැහැදිලි ජනවරමක් ජනතාව විසින් ලබාදී ඇති හෙයින් ද;

ඉහත කී ජනාධිපතිවරණයේදී ජනතාව ප්‍රකාශ කරන ලද අභිප්‍රාය බලගැන්වීමට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කෙරෙන්නා වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මතකර ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා විසින් සිය අභිලාෂය පැහැදිලිව ප්‍රකාශකර ඇති හෙයින් ද;

විධායක ජනාධිපති ධූරය අහෝසි කෙරෙන්නාවූ ද, මනාප ඡන්ද ක්‍රමය ඉවත් කර ජනතා නියෝජනය සාධාරණව පිළිබිඹු කරන්නා වූ මැතිවරණ ක්‍රමයක් සහතික කෙරෙන්නා වූ ද, සියලු පුරවැසියන්ගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් ශක්තිමත් කරන්නාවූ ද, ජාතික ප්‍රශ්නයට ව්‍යවස්ථාමය විසඳුමක් සපයන්නාවූ ද, ජාතික ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කරන්නා වූ ද, නීතියේ ආධිපත්‍යයට ගරු කෙරෙන දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කරන්නා වූ ද, ජනතාවගේ මූලික අයිතීන් හා නිදහස මගින් මානව අභිමානය තහවුරු කරන්නාවූ ද වගකිව යුතු, වගවන්නාවූ ආණ්ඩු ක්‍රමයක් ප්‍රවර්ධනය කරන්නා වූ ද, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මතකර ගැනීමේ අවශ්‍යතාවය මතුවී ඇති හෙයින් ද;

1. ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම පිළිබඳව සලකා බලා ජනතාවගේ අදහස් හා උපදෙස් ලබාගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව යටතේ ඒ වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් පාර්ලිමේන්තුව විසින් සලකා බලනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් සැකසීමේ කාර්ය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විතවන මෙහි මින් මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන පාර්ලිමේන්තු කාරක සභාවක් තිබිය යුතු යැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් තෝරා පත්කර ගත යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයන් හත් (7) දෙනෙකු සිටිය යුතු ය.

ගරු කථානායකතුමා නොපැමිණි අවස්ථාවන්හිදී, මණ්ඩලයේ රැස්වීම්වල මුලසුන හොබවනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ නියෝජ්‍ය සභාපතිවරයන් අතුරින් අයෙකු තෝරා පත් කළ යුතු ය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ රැස්වීම් සඳහා ගණපූරණය විස්සක් (20) ක් විය යුතු ය.

4. (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා උපදේශකවරුන්;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා නීති ලේකම්වරයෙකු හා එකී නීති ලේකම්වරයා සඳහා සහායකයින්;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා 5 වන වගන්තියේ යොමුගත කමිටුවල කටයුතු වාර්තාකරණය පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩලය; සහ

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ (සමාජ මාධ්‍ය ඇතුළුව) මාධ්‍ය කාර්ය මණ්ඩලයක්;

සිටිය යුතුය.

ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය ප්‍රචාරණය ලබාදීමෙහිලා මාධ්‍ය කාර්ය මණ්ඩලය විසින් වෙබ් අඩවියක් පිහිටුවා එය පවත්වාගෙන යා යුතු අතර වෙනත් සුදුසු මාධ්‍ය ද යොදා ගත යුතු ය.

අදාළ සෙසු ප්‍රවීණයන්ගේ හෝ විශේෂඥ මතද ඇතුළත්ව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා එහි කාරක සභාවන්හි කටයුතු මෙන්ම මහජන අදහස් / කරුණු ඉදිරිපත් කිරීම්ද, එම වෙබ් අඩවියෙහි ලේඛනගත කොට ප්‍රකාශයට පත්කරන බවට මාධ්‍ය කාර්ය මණ්ඩලය සහතික විය යුතු ය.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය පහත සඳහන් අනු කමිටුවලින් සමන්විත විය යුතු ය:—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් පත් කරනු ලබන, අග්‍රාමාත්‍යවරයා (සභාපති), පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශවයේ නායකවරයා, අධිකරණ අමාත්‍යවරයා හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සෙසු සාමාජිකයින් දහහත් (17) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් යුත් මෙහෙයුම් කමිටුවක්;

මෙහෙයුම් කමිටුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු හා ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ කාර්යය සඳහා වගකිව යුතු ය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් පත්කළ හැකි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත සෙසු අනු කමිටු;

එසේ වුවද, එක් එක් අනු කමිටුවක සාමාජික සංඛ්‍යාව එකොළහ (11) කට නොවැඩි විය යුතු ය.

එක් එක් අනු කමිටුවේ සභාපතිවරයා මෙහෙයුම් කමිටුව විසින් පත්කරනු ලැබිය යුතු ය.

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් එහි පළමු රැස්වීමේදී—

(අ) නියෝජ්‍ය සභාපතිවරයන් තෝරා පත්කර ගත යුතු ය;

(ආ) 5(ආ) වගන්තියේ යොමුගත අනු කමිටු තීරණය කළ යුතු ය; සහ

(ඇ) 5 වගන්තියේ යොමුගත අනු කමිටුවලට සාමාජිකයින් තෝරාපත් කර ගත යුතු ය.

7. අමාත්‍ය මණ්ඩලයට හා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රථම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සලකා බලනු පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් යෝජනා කරමින් යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස මෙහෙයුම් කමිටුවෙන් ඉල්ලා සිටිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සම්මත කරනු පිණිස අග්‍රාමාත්‍යවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ පළමුවැනි රැස්වීමේදී යෝජනාවක් ඉදිරිපත් කළ යුතු ය.

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත ස්වකීය රැස්වීම් පාර්ලිමේන්තුවේ සභා ගර්භයෙහි පැවැත්වීමට මෙයින් බලය පවරනු ලැබේ,

එසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට බස්නාහිර පළාතෙන් පිටත වූ වෙනයම් නිශ්චිත ස්ථානයකදී සිය රැස්වීම් පැවැත්වීමට තීරණය කළ හැකිය.

එසේම, තව දුරටත්, ලිපිලේඛන ඉදිරිපත් කිරීම, යෝජනා ඉදිරිපත් කිරීම හා යම් කරුණක් සම්බන්ධයෙන් ඡන්දය ලබාදීම පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ දී පමණක් සිදුවිය යුතුය.

9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හෝ එයට අයත් යම් කමිටුවක අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් කමිටුවට අවශ්‍ය සේවාවන් අවශ්‍ය වන්නා වූ ඕනෑම ආයතනයකින් ලබාගත යුතු ය.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට හා /හෝ එහි විවිධ අනුකමිටුවලට සහයවනු පිණිස හා උපදෙස් ලබාදෙනු පිණිස සෙසු ප්‍රවීණයන් මෙහෙයුම් කමිටුව විසින් පත්කරනු ලැබිය හැකිය.

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු මහජනතාවට විවෘත විය යුතු ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා අනු කමිටුවල කටයුතු ලේඛනගත කොට වහා ප්‍රකාශයට පත් කළ යුතු ය. සුදුසු අවස්ථාවන්හි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා/හෝ එහි අනු කමිටුවල කටයුතු විකාශනය කිරීම සහතික කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

සැක ඇතිවීම වළක්වනු පිණිස, පෙර කී කරුණු ප්‍රකාශනය සඳහා පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාර, පාර්ලිමේන්තුවේ විශේෂ අවසරය නිශ්චිතව ලබා දෙනු ලබන බවට මෙහිලා නිශ්චිත වශයෙන්ම යෝජනා කෙරේ.

සැක ඇතිවීම වළක්වනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ හා පස්වන වගන්තියේ යොමුගත අනු කමිටුවල කටයුතු පාර්ලිමේන්තුව වෙත සමගාමීව වාර්තා කර ඇත්තා සේ හා මෙහිලා නිශ්චිත වශයෙන්ම බලය ලබාදෙනු ලබන යම් කටයුතු ප්‍රකාශයට පත් කිරීම් මඟින් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත ප්‍රකාර වරදක් සිදු නොවනු ඇති බව තවදුරටත් යොජනා කෙරේ.

12. උපදෙස් ලබාගැනීම සඳහා සහ/හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය ඉදිරියේ කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඕනෑම පුද්ගලයෙකු කැඳවීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට තිබිය යුතු ය.

13. මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ නිර්දේශ පිළිබඳ උපදෙස් ලබාගැනීම සහ / හෝ කරුණු ඉදිරිපත් කිරීම සහ / හෝ වාර්තා කිරීම සඳහා මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ ඕනෑම සාමාජිකයෙකු කැඳවීමේ බලය ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට තිබිය යුතු ය.

14. මෙහි දක්වා ඇති විධිවිධානවලට යටත්ව, ස්වකීය කටයුතු ඉටුකිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හා යාන්ත්‍රණයන් පිළිබඳ තීරණය කිරීමේ බලය ද මෙහිලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයට පවරනු ලැබේ:

එසේ වුවද, එකී තීරණය මෙහෙයුම් කමිටුවේ එකඟත්වය ඇතිව අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මතයකට පසුව ගත යුතු ය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට පටහැනිව කුමක් සඳහන් වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සහ එහි අනුකමිටුවල කාර්ය පරිපාටික රීති මෙම යෝජනා සම්මතයේ දක්වා ඇති පරිදි විය යුතුය.

15. මෙහෙයුම් කමිටුව විසින් ලබා දෙනු ලබන අනුමතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතු පිළිබඳ දැන්වීම අග්‍රාමාත්‍යවරයා හෝ අග්‍රාමාත්‍යවරයා විසින් ඒ සඳහා කලින් කලට නම් කරනු ලබන වෙනත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු විසින් කරනු ලැබිය යුතු ය.

16. 5(ආ) වගන්තියේ යොමුගත එක් එක් අනු කමිටුවක් පත්කිරීමෙන් සති දහයක් (10) ඇතුළත එම අනු කමිටු විසින් ස්වකීය වාර්තා මෙහෙයුම් කමිටුව වෙත භාර දෙනු ලැබිය යුතු ය.

17. 5(ආ) වගන්තිය යටතේ පත්කරන ලද අනු කමිටුවල සහ මහජන අදහස් ලබාගැනීමේ කමිටුවේ වාර්තා සලකා බැලීමෙන් අනතුරුව මෙහෙයුම් කමිටුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. එකී වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් ද සමඟ ඉදිරිපත් කළයුතු ය.

18. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් වාර්තාවේ හා (අදාළ වන්නේ නම්) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි පොදු යෝග්‍යතාවයන් හා මූලධර්ම විවාදයට ගනු ලැබ යෝජිත සංශෝධන ද විවාදයට ගනු ලැබිය යුතු ය. එවැනි විවාදයන් අවසානයේදී "අවසාන වාර්තාවක් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළිබඳ යෝජනා සම්මතයක් මෙහෙයුම් කමිටුව විසින් ඉදිරිපත් කළ යුතු ය." යනුවෙන් මූලාසනය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

19. ඉනික්බිතිව, මෙහෙයුම් කමිටුව විසින් විවාදය අතරතුර යෝජිත යම් සංශෝධනයන් වේ නම්, ඒවා ද සැලකිල්ලට ගනිමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් සළකා බලනු පිණිස අවසාන වාර්තාවක් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් ද ඉදිරිපත් කළ යුතු ය. එකී වාර්තාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් අනුමත කළයුතු බවට යෝජනා සම්මතයක් අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

20. 18 වන වගන්තියෙහි යොමුගත විවාද කාල සීමාව තුළ පහත සඳහන් ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය:—

සභාපතිවරයා හෝ සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක දී, යම් නියෝජ්‍ය සභාපතිවරයෙකු විසින් එක් එක් වගන්තිය අංක පිළිවෙළින් කියවිය යුතු ය.

(i) යම් වගන්තියකට සංශෝධනයක් ගෙන ඒම, හෝ වගන්ති ඉවත් කිරීම හෝ නව වගන්ති ඇතුළත් කිරීම හෝ කළ හැකිය.

(ii) විවාදය මෙම අදියර තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි විස්තර විනා එහි මූලධර්මය සාකච්ඡාවට නොගත යුතු ය.

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි යම් පූර්ව කොටසක් මත එළැඹි යම් තීරණයක් හා අනනුකූල කිසිදු සංශෝධනයක් යෝජනා කළ නොහැකිය.

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත කියවා අවසන් කරන ලදුව, එකී කෙටුම්පත පිළිබඳ විවාදය අවසන් කිරීමට ප්‍රථම, යම් සාමාජිකයෙකුට, සභාපතිවරයාගේ අවසරය මත, ඒ වනවිට ද සම්මතකර ඇති යම් වගන්තියකට සංශෝධනයක් යෝජනා කළ හැකිය.

(v) යම් වගන්තියකට ගෙන එනු ලබන සංශෝධනයක් පිළිබඳ වූ ප්‍රශ්නයක් මුළුමනින්ම මූලාසනය විසින් ඉදිරිපත්කර ඇත්තේ නම් විනා වගන්තියක් කල් දැමිය හැක.

(vi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි ඉතිරි වගන්ති සලකා බැලීමෙන් අනතුරුව හා නව වගන්ති ගෙන ඒමට ප්‍රථම කල්තැබූ වගන්ති සලකා බැලිය යුතු ය.

(vii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි උපලේඛන සලකා බැලීමට ප්‍රථම නව වගන්ති ඉදිරිපත් කළ හැකි අතර ඒවා පළමු වැනි වර කියවූවා සේ සැලකිය යුතුය. ඉනික්බිතිව, එළඹෙන ප්‍රශ්න "වගන්තිය දෙවනවර කියවිය යුතුය" හා "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට වගන්තිය (හෝ සංශෝධිත පරිදි වූ වගන්තිය) එකතු කළ යුතු ය" වේ.

(viii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි උපලේඛන ඉවත් කිරීමෙන් අනතුරුව නව උපලේඛන ඉදිරිපත් කළ හැකි අතර ඒවා නව වගන්ති ස්වභාවයෙන්ම සැලකිය යුතු ය.

(ix) සෑම වගන්තියක් හා උප ලේඛනයක්ම සහ යෝජිත නව වගන්තියක් හෝ උප ලේඛනයක් සම්බන්ධ කටයුතු කළ පසුව, යම් පූර්විකාවක් වන්නේ නම් එය සලකා බලා "මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි පූර්විකාව විය යුතුය" යන ප්‍රශ්නය ඉදිරිපත් කළ යුතු ය.

(x) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතෙහි නාමයට යම් සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම්, සවිස්තරව දක්වා ඇති ඉහත කී කාර්යාවලීන් අවසානයේදී එය සිදුකළ යුතු ය.

21. අවශ්‍ය වෙනස් කිරීම් සහිතව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 42, 43 හා 44 හි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ කටයුතුවලට අදාළ විය යුතු ය.

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ සභිකයන් අතරින් තුනෙන් දෙකක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත අනුමත නොකරන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සහ මෙකී යෝජනාවේ යොමුගත කමිටු විසුරුවා හැරියා සේ සැලකිය යුතු ය.

23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් අනුමත කරන්නේ නම්, වාර්තාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත මෙහෙයුම් කමිටුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු අතර, ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය සහ මෙකී යෝජනාවේ යොමුගත අනුකමිටු විසුරුවා හැරියා සේ සැලකිය යුතු ය.

24. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75(ආ) ව්‍යවස්ථාව හා 120(ආ) ව්‍යවස්ථාව ප්‍රකාර මුළුමනින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් වශයෙන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා තිබෙන පරිදි විශේෂ බහුතරයකින් සම්මත කරගනු ලැබ ජනමත විචාරණයක් මඟින් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරෙන පනත් කෙටුම්පතක් වශයෙන් එකී වාර්තාවේ අන්තර්ගත පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කළ යුතු ය.

25. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 78(1) ව්‍යවස්ථාව ප්‍රකාර එකී පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

26. ඉන්අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154උ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, සෑම පළාත් සභාවකම අදහස් ප්‍රකාශ කිරීමට ජනාධිපතිවරයා විසින් එකී පනත් කෙටුම්පත එකී සෑම සභාවකටම යොමු කරනු ලැබිය යුතු ය.

27. ඉනික්බිතිව, අග්‍රාමාත්‍යවරයා විසින් එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ, පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතු ය.

28. ඉහතින් සඳහන් කළ පරිදි, එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාව ප්‍රකාරව විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කරගත යුතු බවට අග්‍රාමාත්‍යවරයා එකී පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

එකී පනත් කෙටුම්පතට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවේ නම්, මෙකී පනත් කෙටුම්පත විශේෂ බහුතර ඡන්දයෙන් පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද බවත්, ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍ය පිහිටා ඇති ජනතාව විසින් ජනමත විචාරණයකදී අනුමත කරන තුරු පනත් කෙටුම්පත නීතියක් බවට පත් නොවන්නේ ය, යනුවෙන් කථානායකවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාර යෝග්‍ය සහතිකයක් ලබා දිය යුතුය.

29. ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 85(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ජනාධිපතිවරයා විසින් පනත් කෙටුම්පත ජනමත විචාරණයක් මඟින් ජනතාවගේ අනුමතිය පිණිස ඉදිරිපත් කළ යුතුය.

30. පනත් කෙටුම්පත ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කරනු ලැබ තිබේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් සහතික කිරීම මත පනත් කෙටුම්පත නීතියක් බවට පත්වන්නේය.

31. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ, 5 වගන්තියේ යොමුගත අනුකමිටුවල, සහ මෙකී යෝජනාව ප්‍රකාරව පත්කරන ලද කාර්ය මණ්ඩලයේ හා උපදේශකවරුන්ගේ වියදම් ඒකාබද්ධ අරමුදලින් දැරිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාව ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් යෝග්‍ය පියවර ගත යුතු ය.

32. සැකයක් ඇති නොවනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් යෝජිත ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සම්මත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සංශෝධනවලට යටත්ව සම්මත කිරීම පාර්ලිමේන්තුවේ වගකීම විය යුතු බවට මෙහිලා ප්‍රකාශ කෙරේ.

33. සැකයක් ඇති නොවනු පිණිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතක් නොපැමිණි මන්ත්‍රීවරුන් ද ඇතුළුව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක විශේෂ බහුතර ඡන්දයකින් පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබ, ඉනික්බිතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවේ ප්‍රකාරව ජනමත විචාරණයකදී ජනතාව විසින් අනුමත කරන්නේ නම් පමණක් නීතියක් වශයෙන් පැනවිය යුතු බවට මෙහිලා තවදුරටත් ප්‍රකාශ කෙරේ" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*11.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2016 පෙබරවාරි මස 10 වැනි බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

50/'15

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෙරට තේ සමඟ පිටරට තේ මිශ්‍ර කර විදේශ වෙළඳ පොළට යවන බවත්;

(ii) තේ වල තිබිය යුතු ගුණාත්මකභාවය පහත වැටී ඇති බවත්;

(iii) විවිධ ද්‍රව්‍ය මිශ්‍ර කරන ලද තේ, වෙන්දේසියට ඉදිරිපත් කරන බවත්;

(iv) එමගින් ලොව අංක එක දිනා සිටින Ceylon tea නාමයට කැළලක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015.01.01 දිනට මෙරට සිටින තේ අපනයනකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

(iii) ඔවුන් 2014 වසර තුළ අපනයනය කළ තේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) තේ මණ්ඩලය විසින් තේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පරීක්ෂා කරන ක්‍රමවේදය කවරේද;

(ii) තේ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය පිළිබඳව චෝදනා ලැබූ අපනයනකරුවෙකුට එරෙහිව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) එවැන්නෙකුට ලබා දිය හැකි උපරිම දඬුවම කවරේද;

(iv) දඬුවම් ලැබූ නිෂ්පාදකයන් ඉහත (ආ) (ii) ලැයිස්තුවේ සිටීද;

(v) මේ සම්බන්ධයෙන් රටේ පවත්නා නීති ප්‍රතිපාදන ප්‍රමාණවත්වේද;

(vi) නොඑසේ නම්, එම නීති සංශෝධනයට පියවර ගන්නේද;

(vii) එසේ නම්, එම සංශෝධන සිදු කරන්නේ කවර ආකාරයෙන්ද; කවර දිනයකදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

223/'15

2\.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය සඳහා අතුරු අයවැය ඉදිරිපත් කරමින් පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ අවම වැටුප රු.2500/- කින් වැඩි කරන බවට ප්‍රකාශ කළ බවත්;

(ii) එහෙත්, 2015 නොවැම්බර් 01 දින දක්වා කිසිදු පෞද්ගලික අංශයේ සේවකයකුට අදාළ රු. 2500/-ක වැටුප් වැඩි කිරීම නොලැබුණු බවත්;

(iii) රාජ්‍ය සේවකයින්ගේ අවම වැටුප රු. 10,000/-කින් වැඩි කිරීම නිසා, 2016 වර්ෂය සඳහා හිඟ වැටුප ද සමග පෞද්ගලික අංශයේ අවම වැටුප රු.5000/- කින් වැඩි විය යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2015.11.01 දිනට ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය නියෝජනය කරනු ලබන සමස්ත ශ්‍රමිකයින් සංඛ්‍යාව, ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් අතර සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය නොලැබූ ශ්‍රමිකයන් සිටින්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

237/'15

3\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වසරේදී රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් චීනයෙන් පාසැල් නිල ඇඳුම් රෙදි ඇනවුම් කිරීමේදී අමාත්‍ය මණ්ඩල අනුමතියට පටහැනිව කටයුතු කිරීමෙන් රජයට රුපියල් මිලියන 24ක පාඩුවක් සිදුවී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010.11.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, අනුමත පාසල් නිල ඇඳුම් රෙදි ප්‍රමාණය කොපමණද;

(ii) අනුමත ප්‍රමාණය ඉක්මවා ලබා ගෙන ඇති රෙදි ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(iii) නිල ඇඳුම් රෙදි ආනයනය කිරීමේදී සිදුවී ඇති ප්‍රමාදය හේතුවෙන් රජයට සිදුවූ අලාභය කොපමණද;

(iv) උක්ත අලාභය සඳහා වගකිවයුත්තන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ රෙදි මිලට ගැනීමේදී ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් වූ අවම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු කවරේද;

(ii) දෙවන ටෙන්ඩරය තෝරා ගැනීමෙන් රජයට සිදුවී ඇති අලාභය කොපමණද;

(iii) මේ සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩල නිලධාරීන් සිදු කළ චීන සංචාරයට වැය වූ මුදල කොපමණද;

(iv) 2012.09.30 දින වනවිට ගබඩා වෙත නොලැබුණු රෙදිවල වටිනාකම කොපමණද;

(v) එම රෙදි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

240/'15

4\.

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අවදානම් මත බර තැබීමේ ක්‍රමය අනුව, ශ්‍රී ලංකාවේ විදේශ සංචිතවල ප්‍රමාණවත්භාවය පිළිබඳව සෑහීමට පත්වන්නේද;

(ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි, අවදානම් මත බර තැබීමේ නව ක්‍රමය යෙදීමේදී, X; STD; OPL සහ M2 යන විචල්‍යයන්හි දත්ත අනුව, වර්ෂ 2000 සිට 2014 දක්වා, පාවෙන විනිමය අනුපාතික ක්‍රමය යටතේ, විදේශ සංචිතවල ප්‍රමාණාත්මකභාවය, එක් එක් වර්ෂය අනුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේ ගෙවුන මාස 9 තුළ ශ්‍රී ලංකාවේ විදේශ සංචිතවල ප්‍රමාණාත්මකභාවය කෙසේවීද;

(ii) එම තත්ත්වය කෙරෙහි බලපෑ ප්‍රධාන හේතූන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

250/'15

5.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ ද්විතියික පාසැල් 1000 ව්‍යාපෘතියට අයත් කැකිරාව අධ්‍යාපන කලාපයේ, අ/කඩාන්ඩුගම ජායා මුස්ලිම් මහ විදුහල, අනිකුත් දෙමළ මාධ්‍ය පාසැල් අතරින් අ. පො. ස. (උසස් පෙළ) දක්වා පන්ති පැවැත්වෙන එකම දෙමළ මාධ්‍ය විදුහල බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ප්‍රදේශයේ ඇති අනෙකුත් අඩු පහසුකම් සහිත පාසල් දහනවයේ (19) ළමුන්ටද තාක්ෂණ අධ්‍යාපනය හැදෑරීමේ පහසුව සැලකිල්ලට ගෙන, ඉහත පාසල් පරිශ්‍රයේ තාක්ෂණ විද්‍යාගාරයක් ඉදිකිරීම සඳහා උපදෙස් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

277/'15

6.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් නිල ඇඳුම් සඳහා සාමාන්‍යයෙන් වාර්ෂිකව මිල ගණන් කැඳවනු ලබන මාසය කවරේද;

(ii) 2015 වර්ෂය සඳහා මිල ගණන් කැඳවන ලද මාසය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සැපයුම්කරුවන් තීරණය කිරීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 7.9.6 වගන්තිය අනුව දේශීය නිෂ්පාදකයින්ට ලබා දෙන ප්‍රමුඛතාව මෙවර ලබා නොදීමට ඇමති මණ්ඩලය තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එය දේශීය නිෂ්පාදන දිරිගැන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි නොවේද;

(iii) එවැනි තීන්දුවක් ගැනීමට බලපෑ හේතු කවරේද;

(iv) එකී තීන්දුව හේතුවෙන්, දේශීය රෙදි නිෂ්පාදනය ඇන හිටීමෙන් රැකියා අහිමි වීමට සහ විදේශ විනිමය අනවශ්‍ය ලෙස වැය වීමට හැකි බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2016 වසර වෙනුවෙන්, පාසල් නිල ඇඳුම් සඳහා රෙදි වෙනුවට මුදල් වවුචර් ලබා දෙන්නේද;

(ii) 2001 වසරේදී පත්වූ රජය මුදල් වවුචර් ලබා දීම ක්‍රියාත්මක කර එය අසාර්ථක ක්‍රමයක් ලෙස තීරණය කර අත් හරිනු ලැබුවේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

285/'15

7.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් දේවස්ථාන සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) මුස්ලිම් දේවස්ථාන සඳහා මුදල් වෙන් කිරීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිටින මුස්ලිම් දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් ගුරුවරයෙක් සඳහා ගෙවනු ලබන දීමනාව කොපමණද;

(iii) එම මුදල ප්‍රමාණවත්ද;

(iv) එසේ නොවේ නම්, එම මුදල වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

324/'15

8.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාලබේ SAITM පෞද්ගලික වෛද්‍ය උපාධි ප්‍රදානය කරන ආයතනය ආරම්භ කරනු ලැබූ දිනය කවරේද;

(ii) මේ වනවිට එහි ඉගෙනුම ලබන ශිෂ්‍ය කණ්ඩායම් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් ශිෂ්‍ය කණ්ඩායම්වල සිටින ශිෂ්‍යයින් ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ශිෂ්‍යයින් ඉහත කී ආයතනයට සුදුසුකම් ලැබීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) හෝ ඊට සමාන්තර විභාගයක් සමත් වූ වර්ෂය, විෂයධාරාව, එම විභාගයේ ප්‍රතිඵල, "Z" අගය සහ විභාග අංකය එක් එක් ශිෂ්‍යයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ආයතනයේ දැනට සිටින ස්ථිර ආචාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම්, ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, ඔවුන් ඉගැන්වීම් කටයුතු කරනු ලබන දෙපාර්තමේන්තු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 පෙබරවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

73/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.05.25 දින කොළඹ වරායට නුදුරු මුහුදෙහි පිහිටි බොර තෙල් ප්‍රවාහනය කරන නළය අබලන් වීම නිසා බොර තෙල් ප්‍රවාහනය කරන නෞකා සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වූ නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නෞකාවට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නළය අලුත්වැඩියා කිරීමට ගත වූ දින ගණන කොපමණද;

(iv) මේ හේතුවෙන් සපුගස්කන්ද තෙල් පිරිපහදුව සම්පූර්ණයෙන් වසා තැබීමට සිදු වූ දින ගණන කොපමණද;

(v) ඉන්ධන ප්‍රවාහන නළයට සිදු වූ මෙම හානිය හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ සමස්ත අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෝයාවට අවශ්‍ය නළ මිලදී ගැනීමට අවසන් වරට ටෙන්ඩර් කැඳවීමක් සිදු කළ දිනය කවරේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම් හා එම සමාගම් අයත් රටවල් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාදුන් සමාගම කුමක්ද;

(iv) එම සමාගමට ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

89/'15

2.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අ.පො.ස. (සා.පෙළ) සමත් තරුණ තරුණියන්, රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවලට බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ කුසලතාවයන් හා හැකියාවන් මත නොමිලේ ශිල්පීය හෝ වෘත්තීමය පුහුණුවක් ලබාදීම සඳහා දැනට ඇති පහසුකම් ප්‍රමාණවත්ද;

(ii) එසේ නොමැති නම්, පහසුකම් වැඩිකළ යුතු ප්‍රමාණය කවරේද;

(iii) වෘත්තීය හා ශිල්පීය පුහුණුව සඳහා ඇති විෂය මාලාවන් අදට කොතරම් ගැලපේද; එසේ නොමැති නම්, ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත පුහුණුලාභීන් කිසිදු දේශපාලන බලපෑමකින් තොරව, සුදුසුකම් හා හැකියාවන් මත පමණක් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියාවලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තියක් හා සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) රජයේ ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීමේදී, පිරවීමට නියමිත තනතුරු සංඛ්‍යාව එම දැන්වීම සමග පළ කිරීමෙන් තරුණ තරුණියන් අනවශ්‍ය අපේක්ෂා භංගත්වයකට පත්වීම වැළැක්විය හැකි බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

224/'15

3.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013.07.15 වැනි දින උසස් පෙළ විෂය ධාරාව සඳහා තාක්ෂණවේදය නමින් නව විෂය ධාරාවක් හඳුන්වා දුන් බවත්;

(ii) ආරම්භයේදී පාසැල් 252ක ශිෂ්‍යයන් 14,000ක් සඳහා එම විෂය ධාරාව ඇරඹූ බවත්;

(iii) 2016 වසරේ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව තෝරාගත් ශිෂ්‍යයන් 3000කට ඉඩකඩ ලබාදෙන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එකඟ වූ බවත්;

(iv) රජයේ විශ්වවිද්‍යාලයන්හි උපාධි පාඨමාලාවන්ට අමතරව ශිෂ්‍යයන් 6000කට ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) යටතේ අධ්‍යාපනය ලබාදීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතන (University Colleges) ආරම්භ කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂයේ තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වූ පාසැල් සංඛ්‍යාව;

(ii) දෙවැනි කණ්ඩායම ලෙස එම විෂය ධාරාව තෝරාගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(iii) උසස් පෙළ සඳහා තාක්ෂණවේදය හැදෑරූ ශිෂ්‍යයන් අතරින් 2016 වර්ෂයේදී විශ්වවිද්‍යාල සඳහා සහ විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා ඇතුළත් කරගැනීමට සැලසුම් කරනු ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

227/'15

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමි ව්‍යසනින් හානියට පත් තම නිවස සඳහා සහාධිපත්‍ය නිවාසවලින් නිවසක් ලද, ඩබ්. ප්‍රදීප් මහතාගේ දරුවා, 2013 වසරේ මාතර, සුජාතා විද්‍යාලයේ පළමු පන්තියට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වී තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළ හේතු කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප වී තිබේද;

(iv) එසේ නම්, ඊට අදාළ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ප්‍රතික්ෂේප කිරීම් වලින් පසුව, අදාළ දැරිය පාසලට ඇතුළත් කරගෙන, ඒ බව දැනුම් දෙන ලෙස දන්වා අමාත්‍යාංශ ලේකම් හා ජාතික පාසල් අධ්‍යක්ෂ විසින් විදුහල්පතිවරයා වෙත ලිඛිතව දැනුම් දීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ලිඛිත දැනුම් දීම සම්බන්ධයෙන් විදුහල්පතිවරයාගේ ප්‍රතිචාර කවරේද;

(iii) එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර දැරිය පාසලට ඇතුළත් කරගෙන නොමැති බව දන්නේද;

(iv) එම දැරිය පාසලට ඇතුළත්කර නොගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ප්‍රතික්ෂේප කිරීමට අදාළව විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එම දැරියට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

267/’15

5.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුස්ලිම් පල්ලි හා පුන්‍යායතන දේපළ පනත යටතේ, මුස්ලිම් පල්ලි, ජුම්මා පල්ලි, තක්කියා සාවියා යන ආගමික සිද්ධස්ථානවලට අයත් ඉඩම් සහ ගොඩනැගිලි (වක්ෆ් දේපළ) රජයේ විවිධ සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමේදී, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (වක්ෆ් අංශය) දැනුවත් කිරීමෙන් තොරව එම අත්පත් කිරීම් සිදුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වක්ෆ් දේපළ, අත්පත්කර ගැනීමේදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටි (අදාළ පනත අනුව) සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබේද;

(ii) එසේ නම්, එම ගැසට් නිවේදනයේ අංකය හා දිනය කවරේද;

(iii) එහි පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

287/’15

6.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළොන්නාව ප්‍රදේශය හරහා ගමන් කරන්නා වූ මාර්ග අංක 151, 714 සහ 166 සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් බස් රථ යොදවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගවල බස්රථ නොමැති වීම නිසා පීඩාවට පත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම මාර්ගවල ශ්‍රීලංගම බස්රථ යෙදවීම සඳහා ස්ථිර වැඩපිළිවෙළක් සකසන්නේද;

(iii) එසේ නම්, එම මාර්ගවල ගමනාගමන කටයුතු ආරම්භ කිරීමට ගතවන කාලය කොපමණද;

(iv) එම මාර්ගවලට යොදවන බස් රථවලට පෞද්ගලික මගී ප්‍රවාහකයින්ගෙන් හා අනිකුත් කණ්ඩායම්වලින් එල්ල වන තර්ජන හා පීඩා වැළැක්වීමට වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

302/'15

7\.
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුමක් අත්සන් තැබීමට ඉන්දියාව සමග රජය සාකච්ඡා කරමින් සිටින්නේද;

(ii) එකී ගිවිසුම අත්සන් තැබීමට බලාපොරොත්තු වන කාලවකවානුව කවරේද;

(iii) එකී ගිවිසුම "සීපා" නමින් හඳුන්වන විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමෙන් වෙනස් වන ආකාරය කවරේද;

(iv) එකී ගිවිසුම අත්සන් තැබීමට පෙර එහි අන්තර්ගතය පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විද්වතුන්, වෘත්තීයවේදීන් සහ ව්‍යාපාරික ප්‍රජාව සමග සාකච්ඡා කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

74/'15

8\.
ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ජාතික හැඳුනුම්පතක් නොමැති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට ක්‍රියා නොකළේ මන්ද;

(iii) එම පිරිසට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

(v) එම හැඳුනුම්පත් නිකුත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට රජය කටයුතු කරමින් සිටින්නේද;

(ii) එසේ නම්, වයස අවුරුදු 18 ඉක්මවූ සියලු ශ්‍රී ලාංකික පුරවැසියන්ට හැඳුනුම්පතක් ලබා දීමට එම ක්‍රමය යටතේ හැකිවේද;

(iii) ඒ සඳහා ඇති සැලසුම් කවරේද;

(iv) එම නව ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට බලාපොරොත්තුවන මුදල කොපමණද;

(v) නව හැඳුනුම්පත සඳහා ජනතාවගෙන් මුදලක් අයකරගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

288/'15

9\.
ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවය කරන මැන් පවර් සේවකයින්ගේ සේවය ස්ථිර කරන්නේද;

(ii) මැන් පවර් සේවකයන් අලුතින් බඳවා ගැනීමක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iv) බඳවා ගැනීම් සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

75/'15

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව ඇති නොදියුණු තාක්ෂණික උපකරණ මගින් නිවැරදි කාලගුණ අනාවැකි ලබා දීමට අපොහොසත් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මානව හා දියුණු භෞතික සම්පත් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ලබා දීමට බලාපොරොත්තු වන නවීන තාක්ෂණික උපකරණ කවරේද;

(iii) එම නවීන උපකරණ කුමන කටයුතු සඳහා භාවිතා කරන්නේද;

(iv) එම උපකරණ සඳහා වැය වන මුදල කොපමණද;

(v) නවීන තාක්ෂණික උපකරණ ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

133/'15

2\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයේ විශ්වවිද්‍යාල නොවන ආයතන මගින් පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු, ගණකාධිකාරී හා වෙනත් වෘත්තීයවේදී පාඨමාලා සංඛ්‍යාව ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ආයතන එක් එක් පාඨමාලාව සඳහා අයකරනු ලබන පාඨමාලා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති විශ්වවිද්‍යාලවල ගාස්තු අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා කවරේද;

(ii) එම එක් එක් පාඨමාලාව සඳහා අයකරනු ලබන පාඨමාලා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2012 සිට 2015 දක්වා එම ගාස්තුවල ඇතිවූ වෙනස්වීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

220/'15

3.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012.01.01 සිට 2015.01.01 දක්වා, ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් රාජ්‍ය බැංකුවලින්,

(i) ලබාගෙන ඇති මුළු උකස් ණය ප්‍රමාණය;

(ii) ස්වර්ණාභරණ උකස් කර ලබාගෙන ඇති ණය ප්‍රමාණය;

(iii) ස්වර්ණාභරණ උකස් කර ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් සහ පුරුෂයින් සංඛ්‍යාව;

එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) ස්වර්ණාභරණ උකස්කර රුපියල් ලක්ෂ දෙකකට වඩා අඩුවෙන් ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් හා පුරුෂයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ණය ප්‍රමාණය, ඉහත සඳහන් කාලසීමාව තුළ නිකුත් කර ඇති සමස්ත ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

294/'15

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් යතුරුපැදි බෙදා දීමේ වැඩසටහන සඳහා අයදුම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන් අතරින් කිහිප දෙනෙකුට පමණක් යතුරුපැදි ලබා දී තිබෙන්නේද;

(ii) එසේ නම්, තෝරාගත් ක්ෂේත්‍ර නිලධාරීන් කීප දෙනෙකුට පමණක් යතුරුපැදි ලබා දීමට හේතුව කවරේද;

(iii) සෙසු ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරුපැදි ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

295/'15

5.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සංවර්ධන කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වක්ෆ් දේපළක් වන රක්වාන මුහියිද්දීන් ජුම්මා පල්ලියට (ලි.ප. අංක R/236/R09) අයත් ඉඩම් කොටසක් පවරාගෙන තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත දේපළ පවරා ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් කොටස සඳහා වන්දි ප්‍රදානය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

304/'15

6.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෝලීය දෙමළ සංසදයේ සභාපති එස්.ජේ. එමානුවෙල් පියනමට ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදීමට ජනාධිපතිතුමා විසින් ආරාධනා කර තිබේද;

(ii) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අංක 1373 දරන යෝජනා සම්මුතිය යටතේ ත්‍රස්තවාදින්ට සහාය දක්වන සංවිධානයක් ලෙස නම් කර, තහනම් කර තිබෙන ගෝලීය දෙමළ සංසදයේ එකී තහනම ආණ්ඩුව විසින් ඉවත් කර තිබේද;

(iii) එසේ තහනම ඉවත් කිරීමට බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගෝලීය දෙමළ සංසදය, කොටි ත්‍රස්තවාදයට සහය දැක්වීම පිළිබඳ කණගාටුව පළ කිරීමක් හෝ අනාගතයේ දී ත්‍රස්තවාදයට සහාය නොදක්වන බවට ප්‍රතිඥාවක් ලබා දී තිබේද;

(ii) දෙමළ ඊළම නමින් ශ්‍රී ලංකාව තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීමේ අරමුණින් එස්.ජේ. එමානුවෙල් පියනම ප්‍රකාශිතව ඉවත් වී තිබේද;

(iii) ශ්‍රී ලංකාව තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීමට සෘජුව හෝ වක්‍රව, ආධාර හෝ අනුබල සැපයීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157අ. ව්‍යවස්ථාව උල්ලංඝණය වන දඬුවම් ලැබිය යුතු වරදක් බව පිළිගන්නේද;

(iv) එවැනි වරදක් කරන පුද්ගලයෙකුට අනුබල දීමත් වරදක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

76/'15

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී එප්පාවල පොස්පේට් සමාගම් භූමියේ මීටර් 850 ක මාර්ගයේ කාපට් ඇතිරීමට වැය කළ මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) ටෙන්ඩරය ලබා දුන් සමාගම කුමක්ද;

(iv) එම සමාගමට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම්වල නම්, ලිපින, දුරකථන අංක, අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් හා ටෙන්ඩරයේ වටිනාකම එක් එක් සමාගම අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එප්පාවල පොස්පේට් සමාගම තුළ සිදුවූ දූෂණ හා වංචා පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

(iv) නොඑසේ නම්, පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

(vi) එම පරීක්ෂණයේ ප්‍රතිඵල මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

225/'15

8\.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ''පාලම් දහස'' නමින් විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) තෝරාගත් පාලම් 1000 ප්‍රාදේශීය සභා මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අදාළ පාලම් දහස තෝරාගත් ක්‍රමවේදය සහ අදාළ දිනය හා වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) උක්ත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

(ii) අදාළ මුදල් ලබාගන්නා දේශීය හා විදේශීය මූල්‍ය ආයතන කවරේද;

(iii) ඒ සඳහා වූ පොළී අනුපාතය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මෙම පාලම් දහස ඉදිකිරීම සඳහා වගකීම් භාරදුන් ඉදිකිරීම් සමාගම් කවරේද;

(ii) අදාළ සමාගම් හෝ ආයතන සමග ඉදිකිරීමේ ගිවිසුම් අත්සන් කළ දිනයන් සහ අදාළ ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් අවසන් කළ යුතු දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

306/'15

9\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 නොවැම්බර් 10 දින හෝ ඊට ආසන්න දිනයකදී ඕස්ට්‍රේලියානු විදේශ ඇමතිනි ජුලී බිෂොප් හමුවූ දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙකු ඇතුළු නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට නියමිත යුද අපරාධ අධිකරණයේ කටයුතු කිරීම සඳහා ඕස්ට්‍රේලියානු විනිසුරුවරුන් එවන මෙන් ඉල්ලා සිටි බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී නියෝජිත පිරිස රජයේ යම් විධායක තනතුරු දරන්නේද;

(ii) එම පිරිස ජනාධිපතිවරයාගේ විශේෂ තානාපතිවරුන් හෝ නියෝජිතයින් ලෙස පත් කර තිබේද;

(iii) ශ්‍රී ලංකාව වෙනුවෙන් එවැනි ඉල්ලීමක් කිරීමට ඔවුන්ට ඇති බලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා රජයේ ආරාධනයකින් තොරව ඕස්ට්‍රේලියානු විනිසුරුවරුන් මෙරට නඩු කටයුතු සඳහා එවීමට ඕස්ට්‍රේලියානු රජයට යම් බලයක් තිබේද;

(ii) යෝජිත යුද අපරාධ අධිකරණයේ නඩු කටයුතු සඳහා විදේශීය විනිසුරුවරුන්ට ආරාධනා කිරීමට රජය බලාපොරොත්තු වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.6/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.7/'15

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.8/'15

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,— රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මුල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩපිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.9/'15

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩපිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.10 /'15

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි

පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබඳ අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.11/'15

6.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.12/'15

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ1988 සිට 2010 දක්වා වසර 22ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/'15

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.14/'15

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.15/'15

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.16/'15

11.

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.17/'15

12.

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.18/'15

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම,— පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.19/'15

14.

ගරු බුද්ධික පතිරණ මහතා,— රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,— රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.21/'15

15.

ගරු බුද්ධික පතිරණ මහතා,— සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/'15

16\.

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා ඍජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/'15

17\.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/'15

18\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/'15

19\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.26/'15

20\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.27/'15

21\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.28/'15

22.
ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.29/'15

23.
ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.30/'15

24.
ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/'15

25.
ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට (20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/'15

26.
ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/'15

27.
ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/’15

28.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/’15

29.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/’15

30.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/’15

31.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/’15

32.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/'15

33.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/'15

34.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාකවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාකවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/'15

35.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණාධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/'15

36.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.43/'15

37.

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/’15

38.

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රීයව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/’15

39.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/’15

40.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/’15

41.

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/’15

42.

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව සෘජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'15

43.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'15

44.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'15

45.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මගින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/'15

46.

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/'15

47.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින්

නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමූපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'15

48.

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'15

49.

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'15

50.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'15

51.

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මගින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්වීමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/'15

52.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම,— රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රීක විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'15

53.

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම,— නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායි මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරීම මගින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'15

54.

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/'15

55.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/'15

56.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/'15

57.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/'15

58.

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සේවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/'15

59.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/'15

60.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/'15

61.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/'15

62.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/'15

63.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙළීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මගින් ඖෂධ මිල පහත හෙළීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/'15

64.
ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.71/'15

65.
ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.72/'15

66.
ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.73/'15

67.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායිතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායිතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායිතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායිතා කමිටුවක් පිහිටවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'15

68.
ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'15

69.
ගරු බුද්ධික පතිරණ මහතා,— ඉංග්‍රීසීන් රාජද්‍රෝහීන් ලෙස නම් කළ ශ්‍රී ලාංකිකයින් ජාතික වීරයන් ලෙස නම් කිරීම,— වර්ෂ 1815 සිට 1948 නිදහස ලැබීම දක්වා වූ කාලය තුළ ඉංග්‍රීසීන්ට එරෙහිව රට ජාතිය වෙනුවෙන් දිවි නොතකා සටන් කළ ශ්‍රී ලාංකිකයින් රාජ ද්‍රෝහීන් ලෙස නම් කර ඇති අතර ඔවුන් සියලුදෙනාම විශේෂ ගැසට් පත්‍රයක් මගින් ජාතික වීරයන් ලෙස නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'15

70.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳ පොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'15

71.

ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'15

72.

ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයින් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'15

73.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'15

74.

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.81/'15

75.

ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.82/'15

76.
ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.83/'15

77.
ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.84/'15

78.
ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.85/'15

79.
ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.86/'15

80.
ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'15

81.
ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි "වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය" නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.88/'15

82.

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් "මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.89/'15

83.

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.90/'15

84.

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.91/'15

85.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.92/'15

86.

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.93/'15

87.

ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.94/'15

88.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.95/'15

89.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රිය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.96/'15

90.

ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.97/'15

91.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබා දීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.98/'15

92.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.99/'15

93.

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මගින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.100/'15

94.

ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මගින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.101/'15

95.

ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.102/'15

96.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මගින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පලිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.103/'15

97.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ඩ තින්දුක ජාතකය, තෙසකුණ ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.104/'15

98.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.105/'15

99.

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.106/’15

100\.
ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුළු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.107/’15

101\.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/’15

102\.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/’15

103\.
ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/’15

104\.
ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මගින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/’15

105\.
ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'15

106.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'15

107.

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'15

108.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමග පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'15

109.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මගින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'15

110.

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්වී ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'15

111.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'15

112.
ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'15

113.
ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'15

114.
ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.121/'15

115.
ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'15

116.
ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'15

117.

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ

මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'15

118.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.125/'15

119.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'15

120.

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'15

121.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'15

122.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමග සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/’15

123.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම,— මහා ප්‍රජාපතී ගෝතමී තෙරණීන්වහන්සේගෙන් ඇරඹුණු භාරතීය භික්ෂුණී ශාසනය සංඝමිත්තා තෙරණීන්වහන්සේගේ ලංකාගමනයෙන් ශ්‍රී ලංකාව තුළ මැනවින් ස්ථාපිත වුවද, පසුකාලීනව අභාවයට ගිය බැවින්, මෑත යුගයේ දී ශ්‍යාමෝපාලි මහා නිකායේ රංගිරි දඹුලු පාර්ශ්වය විසින් යළි ස්ථාපනය කරන ලද අතර, එලෙස ස්ථාපනය කරන ලද භික්ෂුණී ශාසනයට නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා රජය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන්වහන්සේලා ඇතුලු අදාළ සියළු ක්ෂේත්‍රයන්ගේ මූලිකත්වයෙන් නිසි සංවාදයක් ඇරඹිය යුතු යැයි ද, එම සංවාදය අවසානයේ විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙළක් සැකසිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/’15

124.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව ව්‍යුහාත්මකව විධිමත් කිරීම,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව තුළ සංඝයාවහන්සේලා පාර්ශ්ව ගත වීම හේතුවෙන් ව්‍යුහාත්මකව අසංවිධිත වී ඇති අතර එම නිසා ජාතික හා ජාත්‍යන්තර අභිචාර උපචාරයන්හිදී සංඝයා වහන්සේලා ඒකමතික නොවීම රටට අහිතකර ලෙස බලපාන බැවින් සමස්ථ සංඝ සමාජයේ ඒකමතිකත්වය ඇති කර ගැනීමට හැකි වැඩපිළිවෙළක් සැකසීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/’15

125.

ගරු බුද්ධික පතිරණ මහතා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් කිරීම,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් ලෙස ජනතාවාදීව සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර ඔවුන්ගේ නිර්දේශයන්ට අනුව සංස්ථාවේ පවතින වංචා, දූෂණ හා පරිපාලනමය ගැටලු විසඳා ඵලදායී ජාතික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිසරය රජය මැදිහත්ව නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/’15

126.

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගංජා වැවීමට දේශීය වෛද්‍යවරුන්ට අවසර ලබා දීම,— ඉන්දියාවේ සිට රහසිගත මාර්ග ඔස්සේ රට තුළට ගෙන්වන රසායනික ද්‍රව්‍ය මිශ්‍රිත ගංජා භාවිතා කර නිපදවන දේශීය ඖෂධවල ගුණාත්මක බව අඩුවන බැවින්, ආයුර්වේද ඖෂධ නිපදවීමේදී තම ඖෂධවල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා ගංජා අත්‍යවශ්‍ය ඖෂධයක් ලෙස යොදා ගන්නා රජයේ පිළිගත් ආයුර්වේද වෛද්‍යවරුන්ට සීමාවන් සහිතව ගංජා ශාකය වැවීමට අවසර ලබාදීම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/’15

127.

ගරු බුද්ධික පතිරණ මහතා,— එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීම,— එළවළු තොග වෙළඳාමේදී ක්‍රියාත්මක වන කප්පම් ගැනීම හා මිල තීරණය කිරීම් ආදී ක්‍රියා හරහා ගොඩනැගී ඇති සංවිධානාත්මක වෙළඳ ඒකාධිකාරයන් නිසා එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීමට මෙතෙක් ක්‍රියාත්මක කළ සැලසුම් අසාර්ථක වී ඇති බැවින්, ගොවියාට සාධාරණ මිලක් ලබා දීමේ මූලික අරමුණ කරගත් බලපෑම් වලින් තොර වෙළඳපොළක් රාජ්‍ය වෙළඳ ආයතන මැදිහත්වී නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'15

128.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වැන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.135/'15

129.

ගරු බුද්ධික පතිරණ මහතා,— කාන්තාවන්ට ඇතිවන පීඩාවන් අවම කිරීම,— වත්මන් ගෝලීය සමාජය තුළ කාන්තාවන්ට සිදුවන පීඩාවන් වන ශ්‍රම හා ලිංගික සූරාකෑමට ලක්වීම, පෞද්ගලික දේපළ ක්‍රමය පුරුෂ කේන්ද්‍රීයව විකාශනය වීම, අසමාන ලෙස සැලකීම හා පවුල් සංස්ථාව තුළ සිරගත වීම නිසා ශ්‍රම සංචලතාවයට බාධා ඇතිවීම යන කරුණු ශ්‍රී ලාංකික කාන්තාවන්ට ද ප්‍රධාන වශයෙන් පොදු වන බැවින්, ඔවුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් මෙම පීඩාකාරී වාතාවරණය සමනය කර සහන සැලසීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.136/'15

130.

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නගා සිටුවීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීමට හැකියාවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නොමැත්තේ පවත්නා මානව හා භෞතික සම්පත්හි අඩුව නිසා වන හෙයින්, විද්වත් මණ්ඩලයක් මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇති අඩුපාඩුකම් පිළිබඳ සොයා බලා, ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.137/'15

131.

ගරු බුද්ධික පතිරණ මහතා,— දුර ගමන් සේවා බස් රථවල ගමන් ගන්නා මගීන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන ලබා ගැනීමට පහසුකම් සැලසීම,— දුර ගමන් සේවා බස් රථ ආහාර පාන ගැනීම සඳහා නතර කරනු ලබන ආපනශාලාවන්හි ප්‍රමිතිය ඉතා පහළ මට්ටමක පවතින බැවින් එය මගී ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර වන අතර, එම ආපනශාලාවල ප්‍රමිතිය ඉහළ නැංවීමට නිරන්තරව පසු විපරම් කළ හැකි වන පරිදි සකස් කරන ලද ජාතික වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'15

132.

ගරු බුද්ධික පතිරණ මහතා,— රජය සතු වැවිලි සමාගම් ලාභදායී ආයතන බවට පත් කිරීම,— රජය සතු වැවිලි සමාගම් පාඩු ලබන ආයතන බවට පත්වී ඇති බැවින්, විද්වත් කමිටුවක් පත්කර එම ආයතනවල ලාභදායීත්වය වර්ධනය කිරීමට අවශ්‍ය නිර්දේශ සකස් කර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් එම සමාගම්වල ලාභදායීත්වය ඉහළ දැමීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'15

133.

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී ක්‍රියා නැවැත්වීම,— ශ්‍රී ලංකාවේ වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී වගාවන්, විවිධ ඉදිකිරීම්, වනාන්තර එළිකිරීම් හා රක්ෂිත සීමා මායිම් වෙනස් කිරීම ආදී වන විනාශයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් වැටලීමට විශේෂයෙන් සවිබල ගන්වන ලද පොලිස් වන ආරක්ෂක ඒකකයක් පිහිටුවීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'15

134.

ගරු බුද්ධික පතිරණ මහතා,— කොරල්පර සංරක්ෂණය කිරීම,— සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කොරල්පර විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති බැවින්, ශ්‍රී ලංකා මුහුදු කලාපය අවට ඇති කොරල්පර ආරක්ෂා කර ගැනීමට හා නව කොරල්පර නිර්මාණය වීමට උචිත පරිසර පද්ධති සකස් කිරීම සඳහා අවශ්‍ය නව නියාමනයන් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'15

135.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි හමුදා කඳවුරු වෙනත් ස්ථානවල පිහිටුවීම,— ත්‍රිකුණාමල නාවුක කඳවුර, උතුරු සහ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය සඳහා වූ ප්‍රධාන හමුදා කඳවුර වුවද, යුද්ධය අවසන් වූ පසු පුල්මුඩේ සිට ලංකා පටුන දක්වා කුඩා නාවුක හමුදා සහ යුද හමුදා කඳවුරු ගණනාවක් පිහිටුවා ඇති අතර මේවා ව්‍යවසායකත්වයට, ධීවරයින්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ක්‍රියාකාරකම් වලට බාධකයක් බවට පත්වී ඇති බැවින් හමුදා කඳවුරු සාමාන්‍ය ජන ජීවිතයට උපකාර කිරීම පිණිස වෙනත් ස්ථානවල පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'15

136.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ඔලුවිල්, පාලමුනේ වරාය ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම,— මීටර් 400 ක පමණ ප්‍රදේශයක් තුළ පිහිටි ජනතාව පදිංචි ඉඩම් සමුද්‍ර ඛාදනයට ලක්වී ඇති බැවින් සහ එම ප්‍රදේශයේ දීර්ඝ කාලයක් තිස්සේ පැවති ජලාපවහන පද්ධතිය අවහිර වීම හේතුවෙන් ප්‍රදේශ 10 කට අධික ගම්මානවල ඩෙංගු වැනි මාරාන්තික රෝග පැතිරෙමින් තිබෙන බැවින් සහ ප්‍රදීපාගාරය ද, වරාය සතු නිවාඩු නිකේතනය ද, සමුද්‍ර ඛාදනය නිසා අවදානම් සහගත තත්ත්වයකට පත් වී ඇති බැවින් ඔලුවිල්, පාලමුනේ වරාය ආශ්‍රිතව ඉදිකරනු ලබන දිය කඩනයේ වැඩ කටයුතු සම්පූර්ණ කළ යුතු බවටත්, එකී ධීවර වරාය එම ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනවත් විය යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'15

137.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා,— ගවයින් සඳහා සුදුසු තෘණ බිම් වෙන් කිරීම,— ආසන්න වශයෙන් ගවයින් 250,000කට පමණ තෘණ භූමි අවශ්‍යව සිටින බැවින් සහ කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ රජයේ ප්‍රතිපත්තිය සපුරාගැනීම සඳහා වෙන් කරන ලද තෘණ භූමි දිස්ත්‍රික්කය තුළ පිහිටා නොමැතිකම නිසා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සුදුසු තෘණ භූමි ප්‍රකාශකර, වෙන්කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'15

138.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ආගමික පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්ධනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම සඳහා දීර්ඝ කාලීන පිළියමක් ලෙස පාසල් සිසුන් ඉරිදා උදෑසන දහම් පාසල්, අහදියා (ආගමික) පාසල් යෑම අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.145/'15

139.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— රජයේ ආයතනවලින් ජනතාවට සිදුවන අකටයුතුකම් පිළිබඳ සොයා බැලීමට ආයතනයක් පිහිටුවීම,— රජයේ ආයතන මගින් විවිධ සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාවට සිදුවන අකටයුතුකම් සහ අසාධාරණකම් පිළිබඳ සොයා බැලීම සඳහාත්, එම අසාධාරණකම් විභාග කිරීම සඳහාත් නෛතික බලයක් සහිත ආයතනයක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.146/'15

140.
ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— රට තුළ ඇති යුදමය නටබුන් ප්‍රතිසංස්කරණය කර ජනතා යහපත පිණිස යොදාගැනීම,— රටේ පැවති යුදමය වාතාවරණය හේතුවෙන් ද, යුදමය ක්‍රියාන්විතයන් හේතුවෙන් ද, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළු රටේ සියලුම ප්‍රදේශවල විනාශව තිබෙන්නා වූ ගොඩනැගිලි, ජල ටැංකි, දුම්රිය, බස්රථ හා ගුවන් යානා ආදිය ප්‍රදර්ශන ස්ථාන ලෙස ද, ආරක්ෂක ස්ථාන ලෙස ද, රජයේ වියදමින් නොකඩවා නඩත්තු කර පවත්වාගෙන යෑම ජාතීන් අතර සංහිඳියාව ගොඩනංවා ගැනීමට බාධාවක් වී ඇති බැවින්, රටේ වත්මන් තරුණ පරම්පරාව සහ අනාගත පරම්පරාව අතරින් රටේ සිදුවූ යුදමය විනාශයන් සම්බන්ධ මතකයන් තුරන් කිරීමේ අරමුණින් යුතුව මෙලෙස විනාශයට පත්වූ ස්ථාන හා අනෙකුත් දේපළ නැවත ප්‍රතිසංස්කරණය කර මහජන යහපත උදෙසා ඒවා භාවිතා කිරීමට රජය නිර්මාණාත්මක පියවරක් ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'15

141.
ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම,— දශක ගණනාවක සිට උතුරු පළාතේ පැවති යුදමය වාතාවරණය තුරන් වී සාමකාමී ජීවන රටාවකට ජනතාව දැන් අවතීර්ණ වී සිටින අතර පසුගිය කාලයේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් නිසා ද, යුදමය වාතාවරණය හේතුවෙන් ද, ඝාතනයට ලක්වූ සියලු ජාති, ආගම් හා සමාජවලට අයත්, සියලුම භාෂාවන් කතාකරන ජනතාව, ශ්‍රී ලාංකිකයින් ලෙස සිහිපත් කරමින්, එම ජනතාව මව්බිම වෙනුවෙන් ද, ඔවුන් කළ පරිත්‍යාගයන්වලට ගෞරව කිරීම සඳහා ද, උතුරු පළාතේ ඕමන්තේ ප්‍රදේශය තුළ සුදුසු ස්ථානයක "අනුස්මරණ ස්මාරකයක්" තැනීමට ද, එම යුදමය තත්ත්වය නිසා දිවි අහිමි වූ සියලුම ජාති, ආගම් හා භාෂාවන් කථා කරන ජනතාව සිහිගැන්වීම සඳහා සුදුසු දිනයක් නම් කොට සෑම වසරක් පාසාම එම දිනය සැමරීමට ද රජය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.148/'15

142.
ගරු ප්‍රසන්න රණවීර මහතා,— රජයේ සේවකයින්ගේ මූලික වැටුපෙන් ගණනය කරන 40% අවකරණ සීමාව දීමනා සහිත දළ වැටුපට ගණනය කිරීම,— රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය අනුව ණය ලබා ගැනීමේ දී 40% අවකරණ සීමාව ගණනය කරනුයේ මූලික වැටුප මත පදනම්ව වන බැවින්, රාජ්‍ය සේවකයින්ට හදිසි අවශ්‍යතාවකට හෝ නිවාස අලුත්වැඩියාවකට රාජ්‍ය බැංකුවකින් හෝ රාජ්‍ය අනුබද්ධ ආයතනයකින් ණය මුදලක් ලබා ගැනීමට මෙම යල්පැන ගිය නීතිය බාධාවක් වන අතර, හත් වසරක දේපළ ණය ලබා ගැනීමේ දී, පස් වසරක ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් ද සලකා බලන හෙයින්, මෙම අවකරණ සීමාව අදාළ නොවුණ ද, රජයේ සේවයට අලුතින් බැඳෙන රාජ්‍ය සේවකයෙකුට ඉහත අවකරණ සීමාව හේතුවෙන් ණය මුදලක් ලබා ගැනීම දුෂ්කර වන බැවින් 40% අවකරණ සීමාව දීමනා සහිත දළ වැටුප මත ගණනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.149/'15

143.
ගරු හේෂා විතානගේ මහතා,— මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ නිසි ප්‍රමිතියක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන බහුතරයක් සුදුසුකම් ලත් පාලිකාවන් නොමැතිවීම, නුසුදුසු ස්ථානයක පවත්වාගෙන යාම සහ දරුවන්ට නොගැලපෙන විෂය පථයක් ඉගැන්වීම සහ නිසි ප්‍රමිතියකින් තොරවීම මෙන්ම, මේවා වැඩිදියුණු කිරීම පිණිස පළාත් සභා මගින් සිදු කර ඇති මැදිහත් වීම ද සතුටුදායක තත්ත්වයක නොමැති බැවින් අනාගත දරු පරපුර වෙනුවෙන් මහඟු මෙහෙයක් කිරීම අරමුණු කොට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.150/'15

144.
ගරු හේෂා විතානගේ මහතා,— උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදී මෙතෙක් කල් ක්‍රියාත්මක වූ පක්ෂ පාට භේද ක්‍රමය නොසලකා සාධාරණය ඉටුකිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සැලසුම් කර එය ප්‍රතිපත්තියක් ලෙස සම්මත කිරීමට පියවර ගන්නා ලෙසත්, දේශපාලනඥයන් හමුවේ උපාධිධාරීන් හැල්ලුවට පත් නොකිරීමට වගබලා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.151/'15

145.
ගරු හේෂා විතානගේ මහතා,— වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම,— වතු ආශ්‍රිත දමිළ ජනතාව ජීවත්වන පරිසරය තුළ විදුලිය, ජල පහසුකම් සහ යටිතල පහසුකම් අවම මට්ටමක පවතින අතර එම තත්ත්වය පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටත්, එම ජනතාවගේ පෞද්ගලික ජීවිතයටත් බාධා ඇතිකරන බැවින්, මෙම ලයින් නිවාස සංස්කෘතිය නිමා කර ඒ සඳහා නව විධිමත් තනි නිවාස ක්‍රමයක් සකස් කිරීමට අවශ්‍ය කඩිනම් වැඩසටහනක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.153/'15

146.
ගරු ලකී ජයවර්ධන මහතා,— දේශපාලන හේතූන් මත දිවි නැගුම ප්‍රතිලාභ අහිමිකර ඇති අයට කඩිනමින් සහන සැලසීම,— දිවයින පුරා ක්‍රියාත්මක දිවි නැගුම වැඩසටහන යටතේ දිවි නැගුම දීමනා ලැබිය යුතු විශාල දිළිඳු පිරිසකට දේශපාලන හේතූන් මත එම දීමනාවන් ලබා ගැනීමේ අවස්ථාවන් මග හැරී ඇති බැවින්, කිසිදු භේදයකින් තොරව එම දීමනාවන් ලැබිය යුතු සියලුම දිළිඳු අයට කඩිනමින් ලබා දීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.154/'15

147.
ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මහල් නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ඉඩම් හා නිවාස හිඟයට පිළියමක් වශයෙන් මහනුවර ප්‍රදේශයේ පිහිටා ඇති රාජ්‍ය වැවිලි ආයතනවලට අයත් වගා නොකළ ඉඩම් තෝරාගෙන මහල් නිවාස ක්‍රමයක් ඇතිකොට නිවාස නොමැති මහනුවර දිස්ත්‍රික් මධ්‍යම පාන්තික ජනතාවට කඩිනමින් නිවාස ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.155/'15

148.
ගරු ලකී ජයවර්ධන මහතා,— වසර 12 ක ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටි ත්‍රිවිධ හමුදා සෙබළුන්ට විශ්‍රාම වැටුප් ලබා දීම,— ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදා සේවයේ වසර 22 ක් සම්පූර්ණ වූ පසු විශ්‍රාම යැමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බැවින්, උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේ නියැලී වසර 12 ක් අඛණ්ඩව සේවය කොට එම සේවාවෙන් ඉවත් වී සිටිනා අයවලුන් දැනට ඉතා අසරණ තත්ත්වයෙන් පසුවන බැවින් එම ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ සේවය කළ අයට අර්ධ විශ්‍රාම වැටුපක් ලබා දීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකසා එම අයට සහනයක් සැලසීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.156/'15

149.
ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පවත්නා මාර්ග තදබදය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ දෙවැනි අගනගරය වන මහනුවර නගරය දේශීය හා විදේශිකයන්ගේ සංචාරක මධ්‍යස්ථානයක් වන හෙයින් ද, මහනුවර නගරයට එදිනෙදා විශාල පිරිසක් පැමිණෙන අතර එම ජනතාව මහනුවර නගරයේ හා අවට මාර්ගවල ඇති අධික රථ වාහන තදබදය නිසා මහත් අසීරුතාවයකට පත්වන බැවින් ද, මහනුවර නගරයේ මාර්ග තදබදය අවම කිරීම සඳහා කඩිනම් විසඳුමක් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.157/'15

150.

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ මුස්ලිම් පිරිමි පාසලක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මුස්ලිම් ජනතාව ඉතා වැඩි පිරිසක් ජීවත් වන අතර, මහනුවර නගරය ආශ්‍රිතව මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවිය යුතු යැයි දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ද ඉල්ලීමක්ව පවතින බැවින්, ඉතා කඩිනමින් මහනුවර නගරයේ මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.158/'15

151.

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පිහිටි ජනප්‍රිය පාසල් සඳහා පළමු ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිලි ඉදිකිරීම,— මහනුවර නගරය ආශ්‍රිතව ජනප්‍රිය පාසල් සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට විශාල පිරිසක් ඉල්ලුම් කළත්, එම පාසල්වල ඉඩකඩ සීමිත හෙයින්, දරුවන් ඇතුළත් කිරීම ඉතා අසීරු වී ඇති බැවින් මහනුවර නගරය ආශ්‍රිත ප්‍රධාන පාසල්වලට පළමුවැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිලි ඉතා කඩිනමින් ඉදිකර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.159/'15

152.

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර පල්ලේකැලේ නිදහස් වෙළඳ උද්‍යාන ක්‍රමවත්ව පුළුල් කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින බැවින්, එම අයට රැකියා අවස්ථා කඩිනමින් සපයා දීම සඳහා මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති නිදහස් වෙළඳ උද්‍යාන දෙක ක්‍රමවත් ලෙස සකසා වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව සැලසීමට කඩිනමින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.160/'15

153.

ගරු ලකී ජයවර්ධන මහතා,— උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යළි ස්ථාපනය කිරීම,— අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසරණ වූ උඩරට ප්‍රදේශවාසී ජනතාවට සහන සැලසීම උදෙසා ස්ථාපිත කර තිබූ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව පසුගිය පාලන කාලය තුළ අක්‍රීය තත්ත්වයට පත් කිරීම නිසා උඩරට ජනතාවට සිදුවී ඇති අසාධාරණයන් සාධාරණය කිරීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නැවත ක්‍රමවත්ව ස්ථාපිත කරලීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.161/'15

154.

ගරු ජේ. සී. අලවතුවල මහතා,— සමස්ත ලංකා මට්ටමේ ජයග්‍රහණ ලැබූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අධ්‍යාපන ක්ෂේත්‍රයේ පත්වීම් ලබා දීම,— සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරඟාවලිය/ යෞවන සමාජ ක්‍රීඩා උළෙල/ ජාතික මහා ක්‍රීඩා උළෙල ආදී තරඟ වලින් සමස්ත ලංකා මට්ටමින් පළමුවැනි, දෙවැනි හා තෙවැනි ස්ථාන හිමි කරගත් ක්‍රීඩකයින් සහ සමූහ තරඟවලදී ශූරතාව හා අනු ශූරතාව දිනූ කණ්ඩායමේ ක්‍රීඩකයින්ට අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ගුරුවරුන් ලෙසත් ක්‍රීඩා නිලධාරීන් ලෙසත් පුහුණුවක් ලබාදී තනතුරු ලබාදීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.162/'15

155.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු, ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය පදනම් කරගෙන පිරවීම සහ තරඟ විභාගයෙන් නිදහස් කර III ශ්‍රේණියට පත්කිරීම,— උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන

පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යා පුරප්පාඩු පිරවීම සම්බන්ධව නිසි විශ්ලේෂණයක් කර මෙම තනතුරුවලට අදාළ රාජකාරිවල නිරත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ඔවුන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.163/'15

156.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— උතුරු පළාතේ පළාත් සභාව යටතේ ඇති පාසල්වල වැඩ බලන විදුහල්පතිවරුන් විදුහල්පති තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කිරීම,— උතුරු පළාත් සභාව යටතේ ඇති පාසල්වල දීර්ඝ කාලයක් සේවයේ නියුතු ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් වැඩබලන විදුහල්පතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තරඟ විභාගයෙන් නිදහස් කර, එම නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.167/'15

157.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— හජ් වන්දනා පනතක් හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ සිට වාර්ෂිකව හජ් වන්දනාවේ යෙදෙන බැතිමතුන් විසින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කර ගැනීමටත්, ඒ පිළිබඳ ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කොට නීතිමය ප්‍රතිපාදන සකස් කිරීමටත්, රජය මගින් "හජ් වන්දනා පනතක්" හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2016 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

55/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික පාසල් දරුවන් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පත්වී ඇති බවත්;

(ii) මෙම ජාවාරම් පාසල් දරුවන් යොදාගෙන සිදුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මත්ද්‍රව්‍යය පාසල් තුළට පිවිසීම නැවැත්වීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර පහ තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත් පාසල් ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් නැවත සමාජගත කිරීම සඳහා රජය අනුගමනය කරන ක්‍රියාදාමය කවරේද;

(iii) එසේ සමාජගත කළ දරුවන් පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රියාවලියට සම්බන්ධ පියවරයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

197/'15

2.

ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2003 වසරේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීමේදී එහි සේවය කළ 3100ක් වූ සේවක සංඛ්‍යාවෙන් 1500ක පමණ පිරිසකට රැකියා අහිමි වූ බවත්;

(ii) යම් ආයතනයක් පර්ක් ආයතනය හරහා විකිණීමේදී සේවකයින්හට හිමිවිය යුතු 10% ප්‍රතිලාභයද ඔවුන්ට අහිමි වූ බවත්;

(iii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් අනුව පසුගිය පාලන සමයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නැවත රජයට පවරා ගැනීමක් සිදු වුවද, සේවය අහිමි වූ සේවකයන් සැම දෙනාම නැවත සේවයේ පිහිටුවීමක් සිදු නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නැවත රැකියාව නොලැබීමෙන් අසාධාරණයට ලක්වූ සේවකයින්ට විසඳුමක් ලබාදීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

199/'15

3.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 අප්‍රේල් 5 දින සිට 11 දින දක්වා කොලොම්බියාවේ පැවති ලෝක නාගරික සමුළුවට (WUF) සහභාගි වූ ශ්‍රී ලංකා (රජයේ) නියෝජිත කණ්ඩායමේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) ඒ වනවිට ඔවුන් දැරූ රජයේ තනතුරු කවරේද;

(iii) එම නියෝජිත කණ්ඩායම තෝරා ගැනීමේ පදනම කවරේද;

(iv) එම සංචාරය සඳහා වියදම් කළ මුදල කොපමණද;

(v) එක් එක් අය වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරය සඳහා පාසල් ශිෂ්‍යයෙක් සහභාගී වූයේද;

(ii) එසේ නම්, ඔහුගේ නම, පාසල සහ ඔහුගේ එවකට වයස කවරේද;

(iii) ඔහුට පමණක් එම අවස්ථාව ලබාදීමේ විශේෂත්වය කවරේද;

(iv) උක්ත සංචාරය සඳහා එම ශිෂ්‍යයා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත්තේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

(v) මෙම සංචාරය සඳහා විදේශ අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත්තේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

209/'15

4\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නැගෙනහිර පළාතේ, ඔලුවිල් වරාය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී රජයට පවරා ගන්නා ලද ඉඩම් වෙනුවෙන් මේ වනවිට වන්දි මුදල් ප්‍රදානය කර ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය සහ වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ සඳහා පවරා ගන්නා ලද පුද්ගලයින් 48 දෙනෙකුට අයත්ව තිබූ අක්කර 49.5ක ඉඩමෙහි, ඉඩම් හිමියන් අතරින් මෙතෙක් වන්දි මුදල් ලබාදී නොමැති පුද්ගලයින් සඳහා ඉඩමේ වර්තමාන තක්සේරු වටිනාකම අනුව වන්දි ප්‍රදානය කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

232/'15

5\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් කොළඹ 02, මෝගන් පාරේ, කිව් පොයින්ට් හි, අංක 15 හා 15 A දරන අක්කර 02යි රූඩ් 02යි පර්චස් 35ක් වන ඉඩම සමඟ ඇති වර්ග මීටර් 1600ක් පමණ වන ගොඩනැගිල්ල නීති විරෝධී ආකාරයෙන් දේශපාලන හිතවත්කම් මත රු.25,000/-ක් වැනි සුළු මුදලකට බදු දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ඉඩම බදු දී ඇති ආයතනය කවරේද; ඒ සඳහා අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන්ද;

(ii) ඉහත (අ) හි සඳහන් දේපළ, කුලියට ලබා දීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iii) මාසික කුළිය තීරණය කරනු ලැබුවේ කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී මෙම ඉඩමෙන් පර්චස් 31ක කොටසක් රු.125,000/-ක මාසික කුලියකට ලබාදී තිබූ බව දන්නේද;

(ii) එසේ නම්, 2014 වර්ෂයේදී, රු.25,000/-ක මාසික කුලියකට පර්චස් 435ක් වූ මෙම ඉඩම බදු දීමෙන්, වරාය අධිකාරියට සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) මෙම මූල්‍ය වංචාව පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

256/'15

6\.

ගරු බිමල් රත්නායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011, 2012, 2013, 2014 වර්ෂයන්හීදී,

(i) ළමා අපචාර පිළිබඳ පවරා ඇති නඩු සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ළමා අපචාර පිළිබඳ නඩුවලින් වරදකරුවන් බවට ඔප්පු වූ සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ළමා අපචාර පිළිබඳ නඩුවලින් වරදකරුවන් බවට ඔප්පු වූ සංඛ්‍යාව, එක් එක් වර්ෂයේ පැවරූ මුළු නඩු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

259/'15

7\.

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනාධිපතිවරණයේදී ජනාධිපති ධූර අපේක්ෂක වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කල "මෛත්‍රීපාලනයක් සිය දිනකින් අලුත් රටක්" නම් වැඩසටහනේ අංක 26ට අනුව, උකස් කර ඇති රන් භාණ්ඩ සඳහා ගෙවිය යුතු අධික පොලිය හා දඩ මුදල් රුපියල් ලක්ෂ දෙකක උපරිම වටිනාකමකට යටත්ව කපා හරින බවට ලබා දුන් පොරොන්දුව අනුව පොලී හා දඩ කපා හැරීම නිසා බැංකු සඳහා නොලැබී ගිය පොලී හා දඩ මුදල් ආදායම එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

271/'15

8\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිටපු විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ලෝක වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල අනුව දේශීය වෙළඳපොළේ මිල වෙනස් වන මිල සූත්‍රයක් හඳුන්වා දෙන බව 2015 ජනවාරි 16 දින ප්‍රකාශ කළ බව දන්නේද;

(ii) මෙතෙක් එවැනි මිල සූත්‍රයක් හඳුන්වා නොදීමට හේතු කවරේද;

(iii) එවැනි මිල සූත්‍රයක් හඳුන්වා දීමට ඉදිරියේදී පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

280/'15

9\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීතොටමුල්ල කුණු කන්ද ඉවත් කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) නාගරික සංවර්ධන අධිකාරිය මගින් ටෙන්ඩර් කැඳවන ලද, මීතොටමුල්ල කුණු කන්ද ප්‍රතිචක්‍රීරණ වැඩපිළිවෙළ සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා ලබාදෙන රාජ්‍ය මැදිහත්වීම කවරේද;

(iv) මෙම ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළ ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළෙහි පළමු අදියර යටතේ කොළඹ නගරයේ කුණු ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන්නේද;

(ii) එසේ නම්, දෙවන අදියර ලෙස මීතොටමුල්ල කුණු කන්දේ ඇති කුණු ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන්නේද;

(iii) මෙම කුණු කන්ද නිසා පීඩාවට පත්ව සිටින කුණු කන්ද අවට ජීවත්වන සාමාන්‍ය ජනතාවට සාධාරණයක් ඉටු කිරීම සඳහා කොළඹ මහානගර සභාව සමග එක්ව වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

307/'15

10.

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැයකළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලබාගත් ආකාරය කවරේද;

(iii) එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මෙහි පවත්වා ඇති අන්තර්ජාතික එක්දින, ටෙස්ට් සහ විස්සයි විස්ස තරඟ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරි වර්ෂයේදී එම ක්‍රීඩාංගණයේ තරඟ පැවැත්වීමට සැලසුම්කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය විවාහ මංගල උත්සව සඳහා බදු දීමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා දිනකට අය කරනු ලබන මුදල කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් කරුණ සම්බන්ධයෙන් ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

308/'15

11.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදල, ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා යොදා ගනු ලැබුවේද;

(iii) එසේ නොමැති නම්, එම මුදල් වැය කරන ලද කාරණය කවරේද;

(iv) මෙම මුදලට අමතරව ක්‍රීඩාංගණය තැනීම සඳහා විදේශ ආධාර හෝ වෙනත් දේශීය අරමුදල් ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2011 ක්‍රිකට් ලෝක කුසලානය වෙනුවෙන් ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයෙන් ලැබුනු මුදල කොපමණද;

(ii) බෙත්තාරාම, පල්ලෙකැලේ සහ සූරියවැව ක්‍රීඩාංගණ නවීකරණය හෝ තැනීම වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ක්‍රීඩාංගණ නවීකරණය හෝ තැනීම් කටයුතු සිදුකළ ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) නවීකරණය හෝ තැනීම සඳහා ගෙවන ලද මුදල එක් එක් ක්‍රීඩාංගණය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම නවීකරණ හෝ තැනීම් කටයුතු සිදුකළ ආයතනවලට ගෙවීමට ඇති හිඟ මුදල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

58/'15

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 හා 2014 යන වර්ෂයන්හි උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන් සඳහා රජයේ වියදමින් සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, එම විදේශ සංචාර සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන් ගණන හා ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාරයන් සඳහා පළාත් සභාව වියදම් කළ මුදල එක් එක් මන්ත්‍රීවරයාට වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන්ට සහභාගී වූ හේතු කවරේද;

(ii) එම සංචාරයන්ගෙන් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්ත්‍රීවරුන්ට අමතරව පළාත් සභාවේ වියදමින් වෙනත් පුද්ගලයින් විදේශ සංචාරයන්ට සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම පුද්ගලයින් විදේශගත වීමට හේතු කවරේද;

(iv) එයින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 පෙබරවාරි මස 24 වැනි බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

83/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධ ශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන දෙමළ ජාතික බෞද්ධයන් පිළිබඳ සංගණනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම දෙමළ ජාතික බෞද්ධයන් සංඛ්‍යාව කොපමණද;

(iii) උතුරු පළාත තුළ ජීවත් වන දෙමළ ජාතික බෞද්ධයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සඳහන් ආකාරයේ සංගණනයක් කර නොමැති නම්, එවැන්නක් සිදු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ දෙමළ ජාතික භික්ෂූන් වහන්සේලා වැඩ සිටින්නේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) යාපනයේ දෙමළ බෞද්ධ ජනතාවට තම ආගමික කටයුතු කරගෙන යෑමට හා දහම් අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

187/'15

2\.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනවාරි මස 09 වැනිදා උදෑසන අරලියගහ මන්දිර පරිශ්‍රයේ දී රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් සිදුවූවා යැයි වර්තමාන රජයේ වගකිව යුතු දේශපාලනඥයින් ප්‍රකාශ කළ බවත්;

(ii) එවැනි කුමන්ත්‍රණයක් සිදු වූ බවට විදේශ අමාත්‍යවරයා සහ රජයේ මාධ්‍ය ප්‍රකාශක අමාත්‍යවරයා විසින් කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාවේදී සහ පාර්ලිමේන්තු සභා ගර්භයේදී ප්‍රකාශ කළ බවත්;

(iii) එම කුමන්ත්‍රණය පිළිබඳව සොයා බැලීම සඳහා ශ්‍රී ලංකා පොලීසිය විසින් පරීක්ෂණයක් පැවැත්වූ බවත්;

(iv) අදාළ පරීක්ෂණවලින් හෙළිවී ඇති කරුණුවලට අනුව හිටපු ජනාධිපතිවරයා හෝ හිටපු ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා ජනවාරි 09 වැනි දින කිසිදු රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් සිදු කොට නොමැති බව තහවුරුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iii) හි සඳහන් පොලිස් පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

(ii) එම පරීක්ෂණයට අනුව චූදිතයින්ට එරෙහිව නඩු පැවරීම සඳහා පොලීසිය කටයුතු කරන්නේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

(iv) එම පරීක්ෂණය අනුව, 2015 ජනවාරි 09 වැනි දින උදෑසන අරලියගහ මන්දිරයේදී කිසිදු රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයක් සිදුවී නොමැති බවට ප්‍රකාශයක් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

189/'15

3\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ, කොම්පඤ්ඤ වීදියේ පිහිටි ආරක්ෂක සේවා පාසල වෙනුවෙන් 2008 වර්ෂයේ සිට මේ දක්වා අධ්‍යාපන අමාත්‍යාංශය වැය කළ මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම විද්‍යාලයේ සිසුන්ගෙන් මුදල් එකතු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය අවසර ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම අවසරය ලබාදුන් ලිපිය සභාගත කරන්නේද;

(iv) සිසුන්ගෙන් එකතු කළ මුදල් බැරකර ඇති බැංකු ගිණුම කවරේද;

(v) එහි පාසල් සංවර්ධන සමිති ගිණුමක් පවත්වාගෙන යනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

205/'15

4\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩවල කඩවීදිය, බංගලාගෙදර, අංක 21 දරන ස්ථානයේ පදිංචි ඒ. එම්. සහබ්දීන් මහතා, මහ/මදීනා ජාතික විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ කම්කරුවෙකු ලෙස 2006 වර්ෂයේ සිට සේවය කරන බවත්;

(ii) ඔහුගේ සේවය සහ සේවා කාලය සැලකිල්ලට ගෙන අනියම් හෝ තාවකාලික පදනම මත සේවයේ පිහිටුවීම සඳහා අදාළ ලිපිලේඛන විටින් විට මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබුවත්, ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

(iii) අවසන් වරට, 2014.11.18 දිනැති අයදුම්පත, විද්‍යාලපති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සහබ්දීන් මහතාට අනියම් හෝ තාවකාලික පදනම මත කම්කරු පත්වීමක් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

226/'15

5\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය රජය යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සිදු වූ වංචා දූෂණ විමර්ශනය කිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් රවී අල්ගම මහතාගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(iii) එම කමිටුව පත්කරන ලද දිනය කවරේද;

(iv) අදාළ කමිටුවේ වාර්තාව සකස් කිරීම සඳහා දරන ලද වියදම කොපමණද;

(v) එම වාර්තාව සැකසීම අවසන් කර තිබේද; එසේ නම්, එම දිනය කවරේද;

(vi) එම වාර්තාවෙන් හඳුනා ගත් දැඩි අක්‍රමිකතා, දූෂණ සහ වංචා කවරේද;

(vii) එම කමිටු වාර්තාව සභාගත කරන්නේද;

(viii) අදාළ කමිටු වාර්තාවෙන් චෝදනා ඉදිරිපත් වූ අය ඇත්නම්, ඔවුන්ගේ නම් කවරේද;

(ix) ඔවුන්ට අදාළව ගෙන ඇති විනය හා නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

274/'15

6\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014.01.01 දින සිට 2014.10.31 දින දක්වා සහ 2015.01.01 දින සිට 2015.10.31 දින දක්වා කාලවකවානු තුළ වාර්තා වූ;

(i) මිනීමැරුම්;

(ii) ස්ත්‍රී දූෂණ;

(iii) පැහැර ගැනීම්;

(iv) කප්පම් ලබා ගැනීම්;

(v) මංකොල්ලකෑම්;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

286/'15

7\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වැසි කාලවල දී කොළොන්නාව ප්‍රදේශයේ බොහෝ අතුරු මාර්ගයන් ජලයෙන් යට වන බවත්, ඒ හේතුවෙන් සාමාන්‍ය ජන ජීවිතය අඩාලවන බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළොන්නාව ආසනයේ එලෙස ජලයෙන් යටවන අතුරු මාර්ග හා ප්‍රදේශයන් කවරේද;

(ii) ඒ සඳහා විසඳුම් ලබා දී ජන ජීවිතය නැංවීමේ වැඩපිළිවෙළක් සකසා තිබේද;

(iii) එම ප්‍රදේශවල ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කර, ජලය නිසියාකාරව ගලායාම සඳහා ඇළ මාර්ග සැකසීමේ වැඩසටහනක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩසටහන ක්‍රියාත්මක වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

310/'15

8\.

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය මැතිවරණ කොට්ඨාසයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වනවිට එම ඉඩම් සියල්ලෙහිම මැනුම් කටයුතු සම්පූර්ණ කර තිබේද;

(iii) නොඑසේ නම්, මැනුම් කටයුතු අවසන් කරන දිනය කවරේද;

(iv) වැල්ලවාය මැතිවරණ කොට්ඨාසයේ පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වලින් ජනතාව අතර බෙදා දී ඇති ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(v) මේ වනවිටත් නීත්‍යානුකූල ඉඩම් අයිතියක් නොමැති පිරිස් වෙත නීත්‍යානුකූල ඉඩම් අයිතිය ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

319/'15

9\.

ගරු ජයන්ත සමරවීර මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.11.15 දින වනවිට ශ්‍රී ලංකාව තුළ රජය සතු ඉඩම් ප්‍රමාණය;

(ii) එකී ඉඩම් අතරින් බදු දී ඇති ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජය සතු එක් එක් ඉඩමේ නම හා ප්‍රමාණය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) බදු දී ඇති එක් එක් ඉඩමේ නම, ප්‍රමාණය, බදු දී ඇති කාලය, වාර්ෂික බදු කුළිය හා ඉඩම පිහිටා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා දිස්ත්‍රික්කය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට රජය සතු ඉඩම් විකිණීමට හෝ බදුදීමට සැලසුම් කොට තිබේද;

(ii) විකිණීමට හෝ බදු දීමට සැලසුම් කොට තිබෙන ඉඩම් කවරේද;

(iii) එම ඉඩම් විකුණනු ලබන හෝ බදු දෙනු ලබන පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

327/'15

10\.

ගරු බිමල් රත්නායක මහතා,—කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011, 2012, 2013 සහ 2014 වර්ෂයන්හිදී සේවක අර්ථසාධක අරමුදල සඳහා ලියාපදිංචි වී ඇති සේවකයන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

329/'15

11\.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1980 කාලසීමාව තුළ කින්නියා ප්‍රදේශයේ සංචාරක අධිකරණයක් ක්‍රියාත්මක වූ බවත්, පසුව ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් එය වසා දමා ඇති බවත්;

(ii) ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් වසා දමන ලද කුච්චවෙලි සංචාරක අධිකරණය පසුගිය රජය සමයේදී නැවත ආරම්භ කළද, එම අවස්ථාවේ කින්නියා සංචාරක අධිකරණය නැවත ආරම්භ කිරීම ප්‍රතික්ෂේප වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) යහපාලන රජය යටතේ කින්නියා සංචාරක අධිකරණය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

331/'15

12\.

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014 වර්ෂයේ විද්‍යාපීඨ සඳහා ඉංග්‍රීසි ගුරු අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ විභාගය සඳහා,

(i) අයදුම්පත් කැඳවීම ප්‍රකාශයට පත් කළ දිනය;

(ii) අයදුම්පත් භාරගන්නා ලද අවසන් දිනය;

(iii) විභාග ප්‍රවේශපත් නිකුත් කරන ලද දිනයන්;

(iv) අදාළ විභාගය පැවැත්වූ දිනය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) උක්ත විභාගය සඳහා සුදුසුකම් සපුරනු ලැබූ අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නොලැබුනු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) අපේක්ෂකයින් සඳහා විභාග ප්‍රවේශපත් නිකුත් කිරීමේදී සුදුසුකම් මත තෝරා ගැනීමක් සිදු කළේ නම්, එම සුදුසුකම් කවරේද;

(ii) සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ට ප්‍රවේශපත් නොලැබිය හැකිද;

(iii) සුදුසුකම් සපුරන ලද රත්නපුර දිස්ත්‍රික්කයේ මුදුන්මංකඩ, උඩවලව පදිංචි කේ. වී. අවලා සෙව්වන්දි මහත්මියට විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නොලැබුනු බව දන්නේද;

(iv) අදාළ ප්‍රවේශ පත්‍රය නොලැබීමෙන් ඇයට අසාධාරණයක් සිදුවූ බව පිළිගන්නේද;

(v) ඒ සඳහා ඇය අභියාචනයක් හා මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇතත්, විසඳුමක් නොලැබීමට හේතුව කවරේද;

(vi) ඇයට සිදුවී ඇති අසාධාරණය සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකර සාධාරණයක් ඉටු කරන්නේද;

(vii) අදාළ පරීක්ෂණය ආරම්භ කිරීමට හා අවසන් කිරීමට බලාපොරොත්තු වන දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

337/'15

13.

ගරු නාමල් රාජපක්ෂ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනාධිපතිවරණයෙන් පසු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය තුළ සිදු වූ දේශපාලන පළිගැනීම් සංඛ්‍යාව කොපමණද;

(ii) දේශපාලන පළිගැනීම් නිවැරදි කිරීම සඳහා, සේවයෙන් නෙරපා හරිනු ලැබූ එම නිලධාරීන්, ඔවුන් සිටි තනතුරුවල නැවත සේවයෙහි පිහිටුවා තිබේද;

(iii) මුදල් වංචා, විනය විරෝධී කටයුතු ඇතුළු බරපතල චෝදනාවලට ලක් වූවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව, 2015 ජනාධිපතිවරණයෙන් පසු දේශපාලන නිර්දේශ මත යළි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත කොට හෝ සේවයෙහි පිහිටුවා තිබේද;

(iv) එසේ නම්, ඔවුන්ට එරෙහිව නීතිමය කටයුතු සිදු කිරීමට පියවර ගන්නේද;

යන්න මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

341/'15

14\.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ නාය යාම් සිදු වූ සහ නාය යෑමේ අවදානමට ලක්ව ඇති වතුයායයන්හි පදිංචි පවුල්, නැවත පදිංචි කිරීම සඳහා නව ඉඩම් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) නාය යාම් හේතුවෙන් අවතැන් වූ පවුල් සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) නාය යෑමේ අවදානමට ලක්ව ඇති වතුයායයන්හි පදිංචි පවුල් සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

85/'15

15\.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ, ලුම්බිණි විද්‍යාලයේ ලුම්බිණි රඟහල අබලන් වී ඇති බවත්;

(ii) එය අලුත්වැඩියා කිරීමට මෙතෙක් පියවර ගෙන නොමැති බවත්;

(iii) එම රඟහල අබලන්ව පැවතීම එම පාසලට මෙන්ම කලා ක්ෂේත්‍රයට විශාල පාඩුවක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ලුම්බිණි රඟහල විවෘත කළ දිනය කවරේද;

(ii) එදින සිට මේ දක්වා එය ප්‍රතිසංස්කරණය කර තිබෙන වාර ගණන කොපමණද;

(iii) අවසන් වරට එය ප්‍රතිසංස්කරණය කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලුම්බිණි රඟහල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට වැය කරන මුදල කොපමණද;

(iii) එකී ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

72/'15

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දක්ෂිණ, කටුනායක - කොළඹ සහ පිටත වටරවුම් යන අධිවේගී මාර්ග හේතුවෙන් කුඹුරු ඉඩම්, තෙත්බිම් හා ගංගා පිටාර තැනි ආදියට හානි සිදු වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් ගංවතුර තර්ජනයකට අධිවේගී මාර්ග අවට ජනයා මුහුණ දී සිටින බවත්;

(iii) මෙම පරිසර හානිය සමස්ත රටේම පරිසර තුලිතතාවට බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අධිවේගී මාර්ග හේතුවෙන් ගංවතුර තර්ජනයට ලක් වී තිබෙන ප්‍රදේශ එම තර්ජනයෙන් මුදා ගැනීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) හානියට ලක් වූ පරිසර පද්ධතීන් සංරක්ෂණයට එතුමා පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ(ii)හි සඳහන් ගංවතුර තර්ජනය හා සම්බන්ධ වන අනෙකුත් අමාත්‍යාංශ සමග ඒකාබද්ධ වැඩසටහනක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩසටහන කුමක්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

191/'15

2\.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 - 2014 දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් මිලදී ගනු ලැබූ නව බස්රථ සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) බස්රථ මිලදී ගැනීම සඳහා වැය කළ මුදල වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම නව බස්රථ ලබාදුන් ඩිපෝ කවරේද;

(iv) ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමෙන් WP NB - 6028, WP NC - 6049, WP NB - 6051, WP NB - 6057, WP NB - 6067, WP NB - 6671, WP NB - 7750, WP NB - 7751, WP NB - 7752, WP NB - 7967, WP NC - 0653, WP NC - 1307, WP NC - 1746 සහ WP NC - 2016 යන අංක දරන බස්රථ 14 මිලදී ගැනීම සඳහා කොපමණ මුදලක් වැයකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(iii) හි සඳහන් බස්රථ 14 දැනට ශ්‍රී. ලං. ග. ම. ය සතුව තිබේද;

(ii) එසේ නම්, එම බස්රථ අයත් ඩිපෝ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

219/'15

3\.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනවාරි මස 01 දින වනවිට මෙරට ලියාපදිංචි කර තිබූ රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGO) කවරේද;

(ii) එම සංවිධානයන්හි ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) 2015.01.01 දින සිට 2015.11.01 දින දක්වා මෙරට ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGO) කවරේද;

(ii) එම සංවිධානයන්හි සංවිධායකයින්ගේ සම්බන්ධීකරණ තොරතුරු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් සංවිධානයන්ට,

(i) 2000.01.01 දින සිට මේ වනතෙක් ලැබී ඇති වාර්ෂික මූල්‍යාධාර ප්‍රමාණය;

(ii) එකී අරමුදල් සපයා ඇති විදේශ රාජ්‍ය හෝ සංවිධාන කවරේද;

(iii) එකී අරමුදල් සම්පාදනය කොට ඇති විදේශ රාජ්‍ය හා සංවිධාන අදාළ අරමුදල් ලබාදී ඇති අරමුණු කවරේද;

යන්න එක් එක් සංවිධානය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා තවදුරටත් මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

229/'15

4\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා බැංකුවේ අභ්‍යන්තර නිලධාරී පුහුණුවන්නන් බඳවා ගැනීම (2014) සඳහා වූ තරඟ විභාගයේ දී සිදු වූ අක්‍රමිකතා හා අසාධාරණයන් පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2014.06.08 දින කැළණිය විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලද එම තරඟ විභාගය සඳහා පෙනී සිටින ලද අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) විභාගයට පෙනී සිටින ලද අපේක්ෂකයින් අතරින් විභාගය සමත් වූ සහ අසමත් වූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) විභාගය සමත් වූ සියලුම දෙනාට පත්වීම් පිරිනමා තිබේද;

(iv) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දූර/2002 චක්‍රලේඛ ප්‍රකාරව ලංකා බැංකුවේ සියලුම අභ්‍යන්තර උසස්වීම් සඳහා ක්‍රමවේදයක් තීරණය කර තිබියදී, සෑම විෂයකටම ලකුණු 40 වන ලකුණු සීමාව 50 දක්වා ඉහළ නැංවීමට හේතුව කවරේද;

(ii) මේ සම්බන්ධයෙන් විභාග අපේක්ෂකයින් කලින් දැනුවත් කර තිබේද;

(iii) පිළිගත් ක්‍රමවේදයක් මත මෙම විභාගය පවත්වා ඇති බවට එකඟ වන්නේද;

(iv) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 5ක් ගතකර ඇති අතර ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා අවස්ථාවක් ලබා නොදීමට හේතු කවරේද;

(v) අගතියට පත් ලංකා බැංකු නිලධාරීන් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

266/'15

5.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා දුම්රිය සේවයට අයත් නාවලපිටිය දුම්රිය ගබඩාවේ කොටසක මප/ගම්/ අල්සෆා ප්‍රාථමික විදුහල පවත්වාගෙන යන බව එතුමා දන්නෙහිද?

(ආ) භාවිතයෙන් තොර දුම්රිය ගබඩා ගොඩනැගිල්ලේ නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ පවත්වාගෙන යන එම පාසල, ස්ථිර ලෙස පවත්වාගෙන යෑමට හැකි පරිදි එම ගොඩනැගිල්ල සකස් කිරීම සඳහා එකී ඉඩම මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

298/'15

6.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.12.08 සිට 2015.01.08 දක්වා වූ ජනාධිපතිවරණ සමයේදී කූට ලේඛණ සැකසීම පිළිබඳව, දේශපාලනඥයින්ට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලැබුනු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම පැමිණිලි ඉදිරිපත්කර තිබුණේ කවරෙකුට එරෙහිවද;

(iii) මෙම පැමිණිලි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, අත්අඩංගුවට ගනු ලැබුවේ කවුරුන්ද;

(v) එම එක් එක් පැමිණිල්ල පිළිබඳ විමර්ශන කටයුතුවල වත්මන් ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

316/'15

7.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දින 100 ව්‍යාපෘතියෙන් සෑම මැතිවරණ කොට්ඨාසයකම මාර්ග සංවර්ධනය සඳහා වෙන් කළ රුපියල් මිලියන 30ක මුදල ඒ ආකාරයෙන්ම ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, මේ වසර තුළ ලබා දෙන මුදල කොපමණද;

(iii) රුපියල් මිලියන 30 සඳහා යෝජනා වූ මාර්ග මෙම වසර තුළ නිම කළ නොහැකි වුවහොත්, ඉදිරි වසර තුළ නිම කිරීමට අවස්ථාව ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේ මහාමාර්ග අමාත්‍යාංශය මගින් අතුරු මාර්ග සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන් කිරීමක් සිදුකරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) එම මුදල් වෙන් කිරීමේදී සැලකිල්ලට ගනු ලබන නිර්ණායකයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

330/'15

8.

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බහුතර මුස්ලිම් ජනතාවක් ජීවත් වන ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ,

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වගකිවයුතු තනතුරුවල සේවය සඳහා මුස්ලිම් නිලධාරින් නොමැති බවත්;

(ii) කුච්චවේලි සහ තම්බලගාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කිසිදු තනතුරක මුස්ලිම් නිලධාරින් නොමැති බවත්;

(iii) පසුගිය රජය විසින් ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හමුදාකරණය කර මුස්ලිම් නිලධාරින් සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම හේතුවෙන් එම නිලධාරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැර ගිය බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) යහපාලන රජය යටතේ,

(i) ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කිසියම් වගකීමක් දරන තනතුරකට අවම වශයෙන් එක් මුස්ලිම් නිලධාරියෙකු හෝ පත්කිරීමට පියවර ගන්නේද;

(ii) කුච්චවේලි සහ තම්බලගාමම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි කුමන හෝ කාර්යභාර තනතුරකට මුස්ලිම් නිලධාරියෙකු පත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

338/'15

9.

ගරු නාමල් රාජපක්ෂ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්දෝදය පාසල් 1000 වැඩසටහන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ,

(i) ඉදිකිරීමට සැලසුම් කළ මහින්දෝදය විද්‍යාගාර සංඛ්‍යාව;

(ii) දැනට ඉදිකර ඇති මහින්දෝදය විද්‍යාගාර සංඛ්‍යාව;

(iii) දැනට ඉදිකර ඇති මහින්දෝදය විද්‍යාගාරවලින් සිසු අයිතියට පත්කර ඇති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) තාක්ෂණ විෂයධාරාව සඳහා මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර (තෙමහල් ගොඩනැගිලි) ඉදිකිරීම යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ,

(i) ඉදිකිරීමට සැලසුම් කළ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සංඛ්‍යාව;

(ii) දැනට ඉදිකර ඇති මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සංඛ්‍යාව;

(iii) දැනට ඉදිකර ඇති මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරවලින් සිසු අයිතියට පත්කර ඇති සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

342/'15

10\.

ගරු ජයන්ත සමරවීර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2014 සහ 2015 සඳහා ජාතික ලොතරැයි මණ්ඩලයේ හා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි අලෙවි ප්‍රවර්ධන කාර්ය සඳහා අලෙවි ප්‍රවර්ධන ආයතන වෙතින් මිල ගණන් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද අලෙවි ප්‍රවර්ධන ආයතන සංඛ්‍යාව, එක් එක් ලොතරැයි මණ්ඩලය සහ ලොතරැයිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලද අලෙවි ප්‍රවර්ධන ආයතන සංඛ්‍යාව, එක් එක් ලොතරැයි මණ්ඩලය සහ ලොතරැයිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ලොතරැයි ප්‍රවර්ධන කාර්යය සඳහා තෝරාගන්නා ලද අලෙවි ප්‍රවර්ධන ආයතන සංඛ්‍යාව, එක් එක් ලොතරැයි මණ්ඩලය සහ ලොතරැයිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතන තෝරාගැනීමේදී සලකා බලනු ලැබූ සුදුසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

343/'15

11\.

ගරු කනක හේරත් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාපට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කර තිබූ මාවනැල්ල නගරයේ සිට හෙම්මාතගම හරහා ගම්පොල දක්වා වූ කි.මී. 26ක් දිග මාර්ගයෙහි සංවර්ධන කටයුතු හිජ්රාගම අල් අස්හර් විද්‍යාලය අසලට, එනම් කි.මී. 15කට සීමා කර තිබේද;

(ii) අඩි 40ක් පළලින් යුතුව ඉදිකිරීමට මුලින් සැලසුම් කර තිබූ එම මාර්ගයෙහි පළල අඩි 34කට සීමා කර තිබේද;

(iii) මේ ආකාරයෙන් උක්ත මාර්ගයේ මුල් සැලසුම් වෙනස් කිරීමෙන්, කොළඹ-නුවර ප්‍රධාන මාර්ගයේ, මාවනැල්ලෙන් හෙම්මාතගම මාර්ගය ආරම්භ වන ස්ථානයේ (S.O. හෝටලය අසල හංදිය) දිනපතා පවතින මාර්ග තදබදයට විසඳුම් ලැබෙන්නේද;

(iv) නොඑසේ නම්, එම ස්ථානයේ මාර්ග තදබදය අවම කිරීමට විකල්ප යෝජනාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

361/'15

12\.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමාන රජයේ මුළු රාජ්‍ය අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම අමාත්‍යවරුන් වෙත පවරා ඇති විෂයයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් වෙත වෙන වෙනම අමාත්‍යාංශ කාර්යාල තිබේද;

(iv) එසේ නම්, එම කාර්යාල පිහිටි ස්ථානවල ස්ථිර ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

143/'15

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය ඉහළ යන බවත්;

(ii) ඉදිරියේදී මෙම තත්ත්වය සමාජයට විශාල බලපෑමක් සිදු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 70ට වැඩි ජනගහනය කොපමණද;

(ii) එම ජනගහනය ගැහැණු හා පිරිමි ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩිහිටි ජනගහනය සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) උක්ත ජනගහනයෙන් විශ්‍රාම වැටුපක් හිමි පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) විශ්‍රාම වැටුපක් නොමැති පිරිසගේ සුභසාධනයට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) වැඩිවන වැඩිහිටි ජනගහනයෙහි ජීවන තත්ත්වය කළමනාකරණය කිරීමට සැලසුම් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

192/'15

14.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෝමාගම, දියගම, මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයට අයත් භූමියේ විශාලත්වය කොපමණද;

(ii) එම භූමිය අයත්ව තිබූ රාජ්‍ය ආයතනය කවරේද;

(iii) එම භූමිය ක්‍රීඩා අමාත්‍යාංශයට හෝ වෙනත් රාජ්‍ය ආයතනයකට පවරාගෙන තිබේද;

(iv) එසේ නම්, එයට අදාළ ලියකියවිලි සභාගත කරන්නේද;

(v) දැනට ක්‍රීඩාංගණයේ පරිපාලනය හා නඩත්තු කටයුතු සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) රජය වැයකළ මුදල සහ පෞද්ගලික පරිත්‍යාග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ සඳහා මුදල් වෙන්කළ අමාත්‍යාංශ කවරේද;

(iv) ඉදිකිරීම් සඳහා මුදල් ලබා දුන් පෞද්ගලික පරිත්‍යාගශීලීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) ක්‍රීඩාංගණය, ක්‍රීඩා කටයුතු සඳහා ලබා දීම ඇරඹූ දින සිට මේ දක්වා අයකරගෙන ඇති මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම මුදල් බැර කර ඇති ගිණුම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය සම්බන්ධ "ක්‍රීඩා සංවර්ධන පදනමක්" තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා කැබිනට් අනුමතිය ලබාගෙන ඇත්තේ කවර අමාත්‍යවරයා විසින්ද; කවර දිනයකදීද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම් , ඒ මන්ද?

299/'15

15.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිලධාරියා විසින් රුපියල් පනස් දහසක් ගෙවීමේ පදනම මත, 2014 වර්ෂයේදී රජයේ නිලධාරීන්ට ලබා දුන් යතුරු පැදි සංඛ්‍යාව;

(ii) 2014 වර්ෂයේදී මුදල් ගෙවා, 2015.10.31 දින වනතෙක් යතුරු පැදි නොලැබුණු නිලධාරීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 ජනාධිපතිවරණ සමයේ පොරොන්දු වූ පරිදි, යතුරු පැදි සඳහා රජයේ නිලධාරීන් විසින් ගෙවන ලද රුපියල් පනස් දහසක මුදල හෝ ඉන් කොටසක් රජය විසින් නැවත නිලධාරීන්ට ගෙවා තිබේද;

(ii) එසේ නම්, මුදල් නැවත ගෙවා ඇති නිලධාරීන් සේවය කරනු ලබන දෙපාර්තමේන්තු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 පෙබරවාරි මස 26 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

77/'15

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.07.01 දින සිට ආනයනය තහනම් කරනු ලැබූ ආහාර සඳහා යොදන රසකාරක වර්ග කවරේද;

(ii) එම එක් එක් රසකාරක වර්ගය, තහනම් කිරීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත තහනම් කළ රසකාරක මෙන්ම, අජිනමොටෝ නොහොත් මොනෝසෝඩියම් ග්ලූටමේට්(MSG) රසකාරකය ද මිනිස් සිරුරට අහිතකර බවත්;

(ii) එය පිළිකා, ස්නායු ආබාධ ඇතුළු දරුණු රෝගාබාධ සඳහා හේතු කාරක වන බවත්;

(iii) වසරකට එම රසකාරක මෙට්‍රික් ටොන් 2200කට වැඩි ප්‍රමාණයක් මෙරටට ආනයනය කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මොනෝසෝඩියම් ග්ලූටමේට් භාවිතය තහනම් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

228/'15

2.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල මෙරටට ලබා ගැනීම වෙනුවෙන් සිදු කරන ලද පූර්ව ප්‍රචාරක සහ අනෙකුත් කාර්යයන් සඳහා පසුගිය රජයේ මැදිහත්වීමෙන් එකතු කර ඇති මුදල කොපමණද;

(ii) එම මුදල් අයථා ලෙස පරිහරණය කර තිබේද;

(iii) මෙම ක්‍රීඩා උළෙල ශ්‍රී ලංකාවට ලබා ගැනීමේ අරමුණින් C W G Hambanthota 2018 (Pvt.) Ltd. නම් සමාගමක් ආරම්භ කර තිබුණේද;

(iv) මෙම සමාගමේ නිල බැංකු ගිණුම් අංකය කවරේද;

(v) එම සමාගමට ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලබාදුන් මුදල කොපමණද;

(vi) ඊට අමතරව, මුදල් ලබා දී ඇති වෙනත් ආයතන සහ පුද්ගලයින්ගේ නම් කවරේද;

(vii) ඉහත සඳහන් අය විසින් ලබා දුන් මුදල් සහ චෙක්පත්වල රිසිට් හෝ චෙක්පත් අංක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම මුදල් බැංකුගත කළ බව තහවුරු කිරීම සඳහා ඇති ලේඛන කවරේද;

(ii) බැංකුගත නොකළ මුදල් ලැබීම්, රිසිට් අංක සහිතව ඉදිරිපත් කරන්නේද;

(iii) මුදල් බැංකුගත නොකිරීමට හේතු කවරේද; එම මුදල් පවතිනුයේ කවර පුද්ගලයෙකු භාරයේද;

(iv) එකතු කළ මුළු මුදලින් දැනට ගිණුමේ ඉතිරිව ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

289/'15

3\.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ (වක්ෆ් අංශයේ) ලියාපදිංචි, මුස්ලිම් පල්ලි, ජුම්මා පල්ලි, තක්කියා, සාවියා, දර්ගා වැනි පුන්‍යායතනවලට අයත් නිශ්චල දේපළ සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් ලේඛනාගාරයක් තිබේද;

(ii) එසේ නම්, එම ලේඛනාගාරය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(iii) එම ලේඛනාගාරයේ දත්ත ගබඩාවේ ලේඛනගත කොට තිබෙන වක්ෆ් දේපළ පිළිබඳ විස්තර එක් එක් දිස්ත්‍රික්කය අනුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වක්ෆ් දේපළ පිළිබඳ දත්ත ගබඩාවක් නොමැතිනම්, දත්ත ගබඩාවක් ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

300/'15

4\.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 09 දින වනවිට ශ්‍රී ලංකාව සතුව පැවැති විදේශ විනිමය සංචිත ප්‍රමාණය ඩොලර් කොපමණද;

(ii) 2015 නොවැම්බර් 26 දින වනවිට ශ්‍රී ලංකාව සතුව පැවැති විදේශ විනිමය සංචිත ප්‍රමාණය ඩොලර් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත මෙතරම් වේගයෙන් පහත වැටීමට හේතුව කවරේද;

(ii) විදේශ විනිමය සංචිත රැක ගැනීමට සහ ඉහළ නැංවීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

320/'15

5\.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අඹතලේ ජල පවිත්‍රාගාරය සඳහා ජලය ලබාගන්නා කැළණි ගඟට මුහුදු ජලය එකතු වීම වැළැක්වීම සඳහා කොන්ක්‍රීට් බැම්මක් ඉදිකර ඇති බවත්;

(ii) එම කොන්ක්‍රීට් බැම්මට මීටර් 500 පහළින් වැලි කොට්ට බැම්මක් ඉදිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැලි කොට්ට බැම්ම ඉදිකිරීම වෙනුවෙන් වාර්ෂිකව ටෙන්ඩර් කැඳවීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වර්ෂයකට වෙන්කරන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ස්ථිර කොන්ක්‍රීට් බැම්මක් තිබියදී, වැලි කොට්ට බැම්මක් ඉදිකිරීම සඳහා වාර්ෂිකව විශාල මුදලක් වැය කිරීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

321/'15

6.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තුළ විශේෂ පර්යේෂණ ඒකකයක් තිබේද;

(ii) එසේ නම්, එහි සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂයේදී උතුරු ප්‍රදේශය ආශ්‍රිතව ක්ෂේත්‍ර සමීක්ෂණ 02ක් සිදු කරනු ලැබුවේද;

(ii) එම සමීක්ෂණ, දෙපාර්තමේන්තුවේ විශේෂ පර්යේෂණ ඒකකය මගින් සිදුකර ගත නොහැකිවූයේ මන්ද;

(iii) එම ක්ෂේත්‍ර සමීක්ෂණ 02 සිදුකළ පෞද්ගලික ආයතනය කවරේද;

(iv) ඉහත සමීක්ෂණ දෙක සඳහා එම ආයතනයට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ආයතනය තෝරා ගනු ලැබුවේ ටෙන්ඩර් කැඳවීම මගින්ද;

(vi) එසේ නම්, ඉල්ලුම් කළ අනෙකුත් ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(vii) මිල ගණන් කැඳවීමේදී හා ඇගයීමේදී එම ආයතනවල පර්යේෂකයන්ගේ සුදුසුකම් හා ආයතනවල පූර්ව සුදුසුකම් ඇගයීමට ලක් කරනු ලැබුවේද;

(viii) එම සමීක්ෂණ වාර්තා දෙක මත පදනම්ව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් ගනු ලැබූ ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

345/'15

7.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ නාය යාම් සිදු වී ඇති සහ නාය යෑමේ අවදානමට ලක්ව ඇති වතුයායයන් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම වතුයායයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම වතුයායයන්හි,

(i) නාය යෑමේ අවදානමට මුහුණ දී සිටින පවුල් සංඛ්‍යාව;

(ii) නාය යෑම් හේතුවෙන් අවතැන්ව සිටින පවුල් සංඛ්‍යාව;

එක් එක් වතුයාය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

353/'15

8.

ගරු විජිත හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පොළ අධ්‍යාපන කලාපයට අයත්, මාවතුර ග්‍රාමයේ පිහිටි, වැලිගහ කනිටු විදුහල වැසීයාමේ තර්ජනයකට ලක්වී ඇති බවත්;

(ii) මෙම විදුහල කඳු මුදුනක පිහිටීම හේතුවෙන් පාසල් දරුවන්ට කි.මී. 3කට ආසන්න දුරක් දිනකට දෙවතාවක් පයින් ගමන් කිරීමට සිදුවී ඇති බවත්;

(iii) ළඳු කැලෑ සහිත පාළු මාවතේ සොහොන් බිමක් පවා පසුකර යාමට සිදුවීම වැනි දුෂ්කරතා පැවතීම හේතුවෙන් ගුරුවරුන් පවා මෙම විදුහලේ සේවයට පැමිණීමට මැලිකමක් දක්වන බවත්;

(iv) මෙම දුෂ්කර තත්ත්වයන් මගහැර පාසල වෙනත් ස්ථානයක පිහිටුවීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අයත්ව තිබූ ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් මිලදීගෙන ඇති බවත්;

(v) ඉහත (iv)හි සඳහන් ඉඩම හා ගොඩනැගිල්ල අයත් වත්තේ, කළමනාකරුගේ බලපෑම මත මෙම පාසල, නව ගොඩනැගිල්ලේ ආරම්භ කිරීම වැළකී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාසල් දරුවන්ගේ සහ දෙගුරුන්ගේ යහපත තකා මෙම පාසල වැසීයාමට ඉඩ නොදී, ඉහත (අ)(v) හි සඳහන් බලපෑම්ද වළකා එය සංවර්ධනය කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

362/'15

9.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධානතම මාර්ග සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(ii) එම ව්‍යාපෘති අතරින්, විදේශීය අරමුදල් සහ දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාල ව්‍යාපෘති අධීක්ෂණය සඳහා ව්‍යාපෘති පැවරුම් පදනම මත උපදේශකවරුන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, එම උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම උපදේශකවරුන් සඳහා තිබිය යුතු වෘත්තීය හා අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iv) ඔවුන් සඳහා ගෙවනු ලැබූ මාසික වැටුප සහ වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම වැටුප් හා දීමනා ගෙවීම සඳහා රජය මගින් වාර්ෂිකව වැය කරන ලද මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

81/'15

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතු හා කර්මාන්තශාලා සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් වතු හා කර්මාන්තශාලාවන්ගේ නම්, පිහිටි ප්‍රදේශ හා වගා කර ඇති බෝග වර්ග මොනවාද;

(ii) එම එක් එක් වත්ත සහ කර්මාන්තශාලාව ආශ්‍රිතව සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) පසුගිය වසර පහ තුළ ඉහත වතු හා කර්මාන්තශාලා අතරින් ලාභ ලැබූ හා පාඩු ලැබූ වතු හා කර්මාන්තශාලා මොනවාද;

(iv) එකී කාල සීමාව තුළ දී එම එක් එක් වත්ත හෝ කර්මාන්තශාලාව ලැබූ ලාභය හෝ පාඩුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) පාඩු ලැබූ රාජ්‍ය වතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබා දී ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් ලබා දුන් වතු හා කර්මාන්තශාලා කවරේද;

(iv) පාඩු ලබන රාජ්‍ය වතු නගා සිටුවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

238/'15

11.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් අංක GB-2865 දරන ඩිෆෙන්ඩර් රථය මාස 03ක කෙටිකාලීන පරිහරණයට ලබාගත් හිටපු අමාත්‍යවරයෙකු හා තවත් හිටපු අමාත්‍යවරයෙකු විසින් වසර 06ක් අනවසරයෙන් භාවිතා කොට, පසුව එහි රෝද හතර ඇතුළු බොහෝ කොටස් ගලවා ඉවත් කර, වැසිය පමණක් පසුගිය 2015 ජනාධිපතිවරණයෙන් පසුව නොදන්වා, ආපදා රථයකින් රැගෙන විත් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ භූමියෙහි අතහැර ගොස් තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිල වශයෙන් අංක GB - 2865 දරන ඩිෆෙන්ඩර් රථය නිදහස් කර තිබූ අමාත්‍යවරයාගේ නම කවරේද;

(ii) එම රථය අනවසරයෙන් කොපමණ කාලයක් භාවිතා කර තිබේද;

(iii) ඒ සම්බන්ධයෙන් ආයතන මට්ටමින් ගෙන තිබූ පියවර කවරේද;

(iv) එම වාහනයේ කොටස් ගලවා ඉවත් කිරීම හේතුවෙන් සිදුවූ අලාභය කොපමණද;

(v) එම අලාභය අය කර ගැනීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය ගෙන තිබූ පියවර කුමක්ද;

(vi) මෙම රාජ්‍ය දේපළ සාපරාධී පරිහරණය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන විමර්ශනයේ වත්මන් ප්‍රගතිය කවරේද;

(vii) ඒ සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා ලෙස ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

296/'15

12.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය සභාව මඟින් පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ව්‍යාපාරිකයන් සඳහා වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, එම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර ලබාදීම පිණිස අනුගමනය කරනු ලබන පිළිවෙත කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එවකට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියටත්, දැනට ප්‍රාදේශීය සභාවටත්, බදු මුදල් ගෙවමින් පදික ව්‍යාපාරිකයින් ලෙස රෙදි වෙළඳාමේ යෙදෙන පුද්ගලයින්ට බලවත් අසාධාරණයක් සිදුවී තිබෙන හෙයින්, එම කඩ කාමර ලබාදීමේදී, පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක 1980/46 දරන චක්‍රලේඛයේ අංක 3 සහ 5 යන වගන්තිවල සඳහන් උපදෙස් සැලකිල්ලට ගැනීමට උපදෙස් දෙන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

301/'15

13.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝක වෙළඳපොළෙන් බොරතෙල් මිලදී ගත් දින සිට දේශීය වෙළඳපොළේදී පාරිභෝගිකයාට විකිණීම දක්වා ගතවන කාලය කොපමණද;

(ii) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2014 නොවැම්බර් මාසය සහ 2015 අගෝස්තු මාසය තුළදී බොරතෙල් මිලදී ගත් මාසික සාමාන්‍ය මිල කවරේද;

(iii) ලෝක වෙළඳපොළෙන් පෙට්‍රල් මිලදී ගත් දින සිට දේශීය වෙළඳපොළේදී පාරිභෝගිකයාට විකිණීම දක්වා ගතවන කාලය කොපමණද;

(iv) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2014 දෙසැම්බර් මාසය සහ 2015 සැප්තැම්බර් මාසය තුළදී පෙට්‍රල් මිලදී ගත් මාසික සාමාන්‍ය මිල කවරේද;

(v) 2015 ජනවාරි 09 වැනි දින සහ 2015 ඔක්තෝම්බර් 09 වැනි දින ශ්‍රී ලංකාවේ පෙට්‍රල් ලීටරයක සිල්ලර මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ලෝක වෙළඳපොළේ ඛනිජතෙල් මිල පහත වැටීමේ වාසිය පාරිභෝගිකයාට ලබා නොදෙන්නේ මන්ද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

325/’15

14.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ වාහන සඳහා දූම් සහතික නිකුත් කරන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) දූම් සහතික නිකුත් කිරීමේ බලයලත් ආයතන කවරේද;

(iii) එම ආයතන දූම් සහතික නිකුත් කරනු ලබන්නේ කවර වර්ෂයක සිටද;

(iv) දූම් සහතික නිකුත් කිරීම ඇරඹූ වර්ෂයේ සිට එක් එක් ආයතනය ඉපැයූ ආදායම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එක් එක් වාහන කාණ්ඩය අනුව දූම් සහතික නිකුත් කිරීමේදී අයකරනු ලබන ගාස්තුව කවරේද;

(vi) එම ආයතන දූම් සහතික ගාස්තු සඳහා රජයට ගෙවනු ලබන මුදල එක් එක් වාහන කාණ්ඩය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) එම ආයතන විසින් දූම් සහතික නිකුත් කිරීම ඇරඹූ වසරේ සිට රජයට ගෙවූ මුදල ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(viii) එම ආයතන විසින් රජයට ගෙවීමට හිඟ මුදල් තිබේද;

(ix) එසේ නම්, එම හිඟ මුදල ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(x) එම ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් හා ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

346/’15

15.

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ පැවති පොදුරාජ්‍ය මණ්ඩලීය නායක සමුළුවට (CHOGM) සමගාමීව සූරියවැව ප්‍රදේශයේ ටෙනිස් පිටියක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණේද;

(ii) එසේ නම්, ඒ සඳහා තෝරාගෙන තිබෙන ඉඩමේ අයිතිකරු කවුරුන්ද;

(iii) එම ඉඩම සඳහා මෙතෙක් ගෙවා ඇති මුදල කොපමණද;

(iv) එසේ පෞද්ගලික හිමිකරුවෙකුට අයත් ඉඩමකට මුදල් ගෙවීම් කර ඇති පදනම කවරේද;

(v) එම ඉඩම සඳහා තක්සේරු වාර්තාවක් ලබාගෙන තිබේද;

(vi) එම ටෙනිස් පිටිය ඉදිකිරීමේ වර්තමාන තත්ත්වය කවරේද;

(vii) එහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට පියවර ගන්නේද;

(viii) නොඑසේ නම්, ගෙවූ මුදල් ආපසු ලබා ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*1.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වන අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිළිබඳව කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාව තුළ වැඩිවෙමින් පවතින අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම මෙරට ජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවට පත්වී ඇති හෙයින්ද,

ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමුකර ප්‍රතිකර්ම යෙදීමේ වගකීම මෙම පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති හෙයින්ද,

පහත සඳහන් කාරණා පිළිබඳව කරුණු විමර්ශනයකර සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) පසුගිය වකවානුවේ සිදුවූ අපරාධවල ස්වභාවය, එසේ අපරාධ සිදුවීම සඳහා බලපා ඇති කරුණු කාරණා, අපරාධ සිදුවීම අවම කරගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සහ අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සහ/හෝ සංශෝධනයන්;

(ආ) සිවිල් සහ අපරාධ නඩුවලදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිණිස අනුගමනය කළ යුතු නිසි ක්‍රියා පිළිවෙත් සහ අලුතෙන් පැනවීමට අවශ්‍ය සහ/හෝ සංශෝධනයන්ට ලක්විය යුතු නීති රීති; සහ

(ඇ) ඉහත කරුණුවලට ආනුෂංගික වන්නා වූ සහ අවස්ථානුකූලව, සුදුසුයැයි හා අවශ්‍යයැයි කාරක සභාවට හැඟෙන සහ කාරක සභාව විසින් සලකා බලනු ලබන කරුණට බලපාන වෙනත් කාරණා.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කළ යුතු ය;

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ ඒ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සහය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස (06) හයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 152/'15

2.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු කරුණාරත්න පරණවිතාන මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට අනුෂංගික කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකුටම ඡන්ද අයිතිය තිබීම මූලික මිනිස් අයිතිවාසිකමක් හෙයින් ද;

විදේශගතව රැකියාවන්හි යෙදෙන ශ්‍රී ලාංකීය පුරවැසියන් හට මෙරට පවත්වන මැතිවරණ සඳහා ඡන්දය භාවිතා කිරීමේ අවස්ථාවක් මෙතෙක් නොලැබී ඇති හෙයින් ද;

විදේශගතව රැකියා කරන ශ්‍රී ලාංකිකයන්, ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථිකය පවත්වාගෙන යාමට විදේශ විනිමය ඉපයීමෙන් මහඟු දායකත්වයක් සපයන හෙයින් ද;

විදේශ රැකියා නියුක්තිකයන්ට ගෞරවාන්විතව රැකියා කටයුතු කර ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම රජයේ වගකීමක් වන හෙයින්;

මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීම විදේශගතව රැකියා කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකමක් වන හෙයින් ද; සහ

විදේශගතව රැකියාවන්හි යෙදෙන ශ්‍රී ලාංකිකයින්ට මුහුණ පෑමට සිදුව ඇති දුෂ්කරතාවයන් සහ ඔවුන්ට මැතිවරණයකදී ඡන්දය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශයන් සහිතව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට හැකිවන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කළ යුතු ය.

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් ප්‍රතිඥා හෝ දිවුරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයින්ගේ සහ ප්‍රවීණයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස හයක (06) කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 166/'15

3.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු මනුෂ නානායක්කාර මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු එස්.සී. මුතුකුමාරණ මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කනක හේරත් මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මුදල් අමාත්‍ය, ගරු රවී කරුණානායක මහතාට එරෙහි විශ්වාස භංගත්වය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන හෙයින්ද;

රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙහි ප්‍රධානතම උපකරණය වන්නේ වාර්ෂික අයවැය ලේඛනය වන හෙයින්ද;

විසර්ජන පනත වශයෙන් මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය හා සම්බන්ධිත මූල්‍ය අගයන් ඉතා සවිස්තරාත්මකව, විනිවිද පෙනෙන අයුරින්, උපරිම විශ්වාසය රැකෙන පරිදි, සත්‍ය ලෙස ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ ප්‍රධානතම යුතුකම හා වගකීම වන හෙයින්ද;

මුදල් අමාත්‍ය, ගරු රවී කරුණානායක මහතා පාර්ලිමේන්තුව හා මහජනතාව නොමඟ යවන දූර්නිරූපණය සහිත අයවැය ලේඛනයක් මෙවර (2016) මෙම ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින්ද;

2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණය (වගකීම්) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් මෙම ගරු සභාවට 2015 අප්‍රේල් 20 වැනි දින පිළිගන්වන ලද 2014 වාර්ෂික වාර්තාවේ 85 වැනි පිටුවේ "සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් සඳහා සමස්ත ආයෝජනය රුපියල් බිලියන 164ක් වන අතර, 2013 වර්ෂයේදී සිදුකළ රුපියල් බිලියන 157ට වඩා රුපියල් බිලියන 7ක වැඩි වීමක්" වන හෙයින්ද;

"සාමාන්‍ය අධ්‍යාපනය සඳහා 2014 වර්ෂයේ සිදුකළ රාජ්‍ය ආයෝජනය රුපියල් බිලියන 117ක් වන අතර, එය 2013 වසරේ සිදුකළ බිලියන 108ක ආයෝජනයට වඩා 8%ක වැඩිවීමක්" වන හෙයින්ද;

2016 අයවැය ඇස්තමේන්තුවෙහි II වෙළුම 218 සහ 219 පිටු අනුව, 2015 වසරේදී සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රාග්ධන වියදම බිලියන 17.8 සිට 2016 දී රුපියල් බිලියන 18.3 දක්වාත් රුපියල් බිලියන 0.5කින් පමණ ඉතා සුළු ප්‍රමාණයකින් වර්ධනය වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාවේ අයවැය ලේඛන ඉතිහාසයේ අසාමාන්‍ය හා විස්මිත වෙනසක් ඇති කරමින් 2016 වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වන පුනරාවර්තන වියදම 278%කින් (2015ට සාපේක්ෂව රුපියල් බිලියන 44 සිට බිලියන 167 දක්වා රුපියල් බිලියන 123කින්) රොකට් වේගයෙන් අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති හෙයින්ද;

මෙලෙස අසාමාන්‍ය හා විස්මයජනක ලෙස පුනරාවර්තන වියදම ඉහළ යෑමට බලපෑ ප්‍රධානතම හේතුව නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ කිසිම අයවැය ලේඛනයක සඳහන් නොවූ "රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යෑමේ පිරිවැය - ඉඩම් හා ගොඩනැගිලි" වශයෙන් රුපියල් මිලියන 121,352 හෙවත් රුපියල් බිලියන 121ක ගිණුම් සටහනක් පැවතීම වන හෙයින්ද;

මෙය පුනරාවර්තන වියදමක් ලෙස දැක්වුවද 2016 වර්ෂයේ දී සත්‍ය වශයෙන් වියදම් කරනු ලබන මුදලක් නොවන හෙයින්ද;

2016 වර්ෂයේදී අධ්‍යාපනයට වියදම් නොකරන රුපියල් කෝටි 1210කට අධික මුදලක් පුනරාවර්තන වියදම් ලෙස සටහන් කිරීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ව්‍යාජ ලෙස "පුම්බා පෙන්වා" මෙම ගරු සභාවට සාවද්‍ය තොරතුරු හා සංඛ්‍යා දත්ත ඉදිරිපත් කිරීමෙන් සභාවේ විශ්වාසය සම්පූර්ණයෙන් අහිමි කරගෙන ඇති හෙයින්ද;

තවදුරටත් මුදල් අමාත්‍යවරයා විසින් එම ධූරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනාව සම්මත කරයි.

***** *සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*